# තේ කහට





# තේ කහට

**තේ කහට**

ප්‍රථම මුද්‍රණය : **2021 අගෝස්තු**

ISBN : 978-624-5914-08-1

සංස්කරණය : **ලයනල් ගුරුගේ**

පරිගණක සැකැස්ම : **වාක්‍යා රූ**

ප්‍රකාශනය **: විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**

---

“සියලුම හිමිකම් ඇවිරිණි. ප්‍රකාශකයන්ගේ නිසි අවසරයකින් තොරව මෙම ග්‍රන්ථය සම්පූර්ණයෙන් ම හෝ එහි කොටසක් හෝ ඇතුළත් ඡායාරූප හෝ උපුටා ගැනීම, මුද්‍රිත, ලිඛිත, ඉලෙක්ට්‍රොනික ආදී කවර මාධ්‍යයකින් හෝ පිටපත් කිරීම, පළ කිරීම, විකාශනය කිරීම, අනුවර්තනය කිරීම හා ව්‍යාජ ලෙස සැකසූ පිටපත් අලෙවි කිරීම, බෙදා හැරීම සම්පූර්ණයෙන් ම තහනම් වේ”.

මෙම කෘතියෙහි පිටු අංක 133-153 දක්වා පළ වන්නේ ‘තේ කහට’ ප්‍රදර්ශනය සම්බන්ධයෙන්, විද්වතුන්, මාධ්‍යවේදීන් සහ විවිධ ලේඛක ලේඛිකාවන් පළ කළ අදහස් සහිත ලිපි පෙළකි. එකී ලිපි තුළ අදාළ ලේඛක ලේඛිකාවන්ගේ අදහස් පමණක් අන්තර්ගත වන අතර CPA හෝ GIZ ආයතනයේ අදහස් පිළිබිඹු නොවේ.

---

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන, දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවනු ලැබූයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජනය කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැප වී සිටී.

අංක 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව.

| | | |
|---|---|---|
| දුරකථන | : | +94112081384,+94112081385,+94112081386 |
| ෆැක්ස් | : | +94112081388 |
| විද්‍යුත් තැපෑල | : | info@cpalanka.org |
| වෙබ් අඩවිය | : | www.cpalanka.org |
| මුහුණුපොත | : | www.facebook.com/cpasl |
| ට්විටර් | : | @cpasl |

# පියාසැරිය








7 ‘රත්‍රන්’ නෙළා දුන් ජනතාවගේ වේදනාව
- ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු

9 පෙරවදන
- ඩෙනි ෂයිබ්

11 පෙරවදන
- හොල්ගර් සේව්බර්ට්

13 'තේ කෝප්පයේ රසට
සැඟව ගිය කඳුළු කතාව'
- ලයනල් ගුරුගේ

15 ඡායාරූප භාෂාව නිවැරදිව අල්ලා ගත්
දක්ෂයින්ගේ කතාව
- නදිෂ්ක රණසිංහ, අජිත් සෙනෙවිරත්න

17 ඡායාරූප චාරිකාව

119 තේ කහට
සහෘද නෙත් කැල

















133 තේ කහට ගැන වචනයක් දෙකක්
- මහාචාර්ය සසංක පෙරේරා

135 තේ කහට - වේදනාව දෙස කලාත්මකව බැලීම
මාධ්‍යවේදී ලසන්ත ද සිල්වා

141 ඔබේ තේ කෝප්පයේ කඳුළු
චන්ද්‍රිකා ගාදියසම්
නදීෂා පවුලිස්

145 වතුකරයේ හෘද සාක්ෂිය
- කේ. ප්‍රසන්න

149 තේ කහට ආදරයේ පසු කතාව
- ළහිරු කිතලගම

167 ප්‍රතිචාර බිඳක්....

# 'රත්‍රන්'

## නෙළා දුන් ජනතාවගේ වේදනාව

කඳුකරයේ දෙමළ ජනතා ප්‍රජාවේ තරුණ සාමාජික සාමාජිකාවන් විසින් පවත්වනු ලැබූ "තේ කහට" ඡායාරූප ප්‍රදර්ශනය දියත් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අපි සත්තකින් ම සාඩම්බරයට පත්වෙමු. මෙම සාමාජික සාමාජිකාවන් තම එදිනෙදා ජීවිතයේදී තම ප්‍රජාව අත්විඳින දුෂ්කරතා සහ අගහිඟකම් නිරීක්ෂණය කළ වුන් වීම මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතු වෙයි.

ශ්‍රී ලංකාව තම තේ කර්මාන්තය පිළිබඳව සාඩම්බර වනවා මෙන්ම "සිලෝන්" නාමය වසර ගණනාවක් ම තේ සමග බැඳුණු පර්යාය පදයක් මෙන්ම විය. කෙසේ නමුත් කීර්තිමත් අලංකාරෝක්තීන්  හා සුභ ප්‍රාර්ථනයන් පසුපස පැහැදිලිව දිස්වෙන යථාර්ථය වන්නේ ශ්‍රී ලංකාවේ මෙම "රත්‍රන්" නෙළා දුන් ජනතාව ශත වර්ෂයකට වැඩි කාලයක් අත්විඳි ජීවන තත්ත්වයන් ය. කණගාටුදායක නමුත් ඇත්ත තත්ත්වය වන්නේ ඔවුන්ගේ මෙම කටුක ජීවන තත්ත්වය තුළ වසර සියයකටත් වැඩි කාලයක් තිස්සේ නොවෙනස්ව පවතින ස්ථානයන් පවතින බවය. ඔවුන්ගේ වැටුප්, අවශ්‍යතාවට හා සාධාරණ තත්ත්වයට වඩා බෙහෙවින් පහළ තත්ත්වයක පවතී. විවිධ ජනතාවන්ගෙන් සැදි, විවිධත්වය තුළ එක්සත්කම පවත්නා රටක් ලෙස ශ්‍රී ලංකාව ඉදිරියට යෑමට නම් වතුකරයේ කම්කරුවන්ගේ මෙම ජීවන තත්ත්වයන් පිළිබඳව බරපතළ අවධානයක් යොමු කළ යුතුම ය. වතුකරයේ කම්කරුවන් 3000කට තැපැල් ලිපිනයන් ලබාදීමේ ඇරඹුමක් සාර්ථක ලෙස දියත් කිරීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අපට හැකි වීම පිළිබඳව අපට සාඩම්බරයක් පවතිනවා මෙන්ම එම තත්ත්වය පිළිබඳව සියුම් කනගාටුවක්ද අප තුළ පවතී. තැපැල් ලිපි නිසි වෙලාවට ලැබීමෙහි ප්‍රමාදයන් නිසා වන අහිතකර ප්‍රතිඵල වළක්වාගැනීමේ ප්‍රායෝගික ගැටලුවට

අමතරව තැපැල් ලිපිනයක් තිබීමේ අභිමානය ද සත්තකින්ම සෑම ශ්‍රී ලංකික පුරවැසියෙකුම සතු විය යුතු වූ අයිතියකි.

මෙම ප්‍රදර්ශනයෙහි දී එම ප්‍රජාවේ තරුණ ජනතාව සමග සම්බන්ධව කටයුතු කිරීමට ලැබීම පිළිබඳව ද අපි ආඩම්බර වන්නෙමු. තේ වතුවල ජනජීවිතයේ දිනපතා පවතින යථාර්ථය ඔවුනට වඩා හොඳින් අවබෝධ කරගත හැකි හා අනාගත ලෝකයට උරුම වනු පිණිස වාර්තා කොට තැබිය හැකි වෙනත් කවුරුන් හෝ සිටිය හැකි ද? එසේ දායක වූ තරුණ තරුණියන්ගේ කුසලතාව ප්‍රශංසා කටයුතු මට්ටමක වන අතර අනාගතයේ දී එය තවත් පෝෂණය කළ යුතු හා පෝෂණය විය යුතු යැයි ද මම සිතමි. වැඩිදුරටත් මාගේ අවංක බලාපොරොත්තුව වන්නේ මෙම ජන ප්‍රජාවේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම පිණිස වන දේශපාලන කැපවීම ජනනය කිරීමට සමත් කතිකාවතක් මෙම ප්‍රදර්ශනය මගින් ඇරඹෙනු ඇති බවයි. අපගේ ජනමත නිර්මාපකයන් සහ තීරණ ගන්නන් ඔවුන්ගේ උත්සාහයන් හි දී පෙළඹවීමේ බලවේගය ලෙස මානව ගරුත්වය සියල්ලට ඉහළින් තබා කටයුතු කරනු ඇතැයි ද අපි උදක් ම බලාපොරොත්තු වෙමු.

වැදගත් සහ ශිෂ්ටසම්පන්න සමාජයක් පිළිබඳව පැහැදිලි කිරීමේ දී අවිශායි මාගලිට් සඳහන් කළේ "එය ආයතනයන් විසින් පුරවැසියන් අවමානයට ලක් නොකරන හා පුරවැසියන් එකිනෙකා අවමානයට ලක් කර නොගන්නා සමාජයක්" විය යුතු බවයි. වතුකරයේ තත්වයන් සංවර්ධනය කිරීමේදී ද අප සිහිතබාගත යුතු සත්‍යයක් මෙමගින් නිරූපනය වේ. එමතු ද නොව අපගේ රට එක්සත් සහ සෞභාග්‍යමත් දේශයක් බවට පත් කිරීම අරමුණු කොටගත් ඕනෑ ම උත්සාහයකදී ද මෙය එක සේ අදාළ වේ.

ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු
විධායක අධ්‍යක්ෂ,
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය.

# පෙරවදන

## තේ කහට ඡායාරූප පොත

ඇඟළුම් සහ විදේශගත ශ්‍රමිකයින් සමග එකතුව ශ්‍රී ලංකාවේ වැවිලිකර ප්‍රජාවන් ශ්‍රී ලංකා ආර්ථිකයට වැදගත් ශ්‍රම බලකායේ පළමු ස්ථාන තුන සකසයි. ශ්‍රමිකයින්ගේ ජීවන මට්ටමේ සංකීර්ණත්වය ද ඔවුන්ගෙන් පෙන්නුම් කෙරෙයි. වෙළෙඳ කොන්දේසි මගින් දිගින් දිගට පිළිඹිබු වන පරිදි මෙය යුරෝපය විසඳීමට උත්සහ දරන ප්‍රශ්නයකි. සියලු දෙනා ඇතුළත් කර ගන්නා වෙළෙඳාම මගින්, ගෝලීය වෙළෙඳපොළවල ප්‍රතිලාභ අත්කර ගැනීමට, පුද්ගලයින් වැඩි සංඛ්‍යාවකට අවස්ථාව ලබා දෙයි. වර්ධන අවස්ථා මගින් සංවර්ධනය ඉදිරියට ගෙන යාමටත්, දිළිඳුබවට පිළියම් යෙදීමටත්, සහ ජීවන තත්ත්වයන් ඉහළ දැමීමටත් හැකිවන නිසා යුරෝපය වෙළෙඳාමේ ප්‍රමුකයින් වී සිටියි.

ඇත්ත වශයෙන් ම, වෙළෙඳ විවෘත භාවය මගින් තම හවුල්කරුවන්ගේ ජීවන මට්ටම් ඉහළ යාම සහතික වන පරිදි , ජී එස් පී + සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතිවලට අනුගත වීම ඇතුළුව, යුරෝපා සංගමය සහ එහි සාමාජික රටවල් තම වෙළෙඳ අවශ්‍යතා යාවත්කාලීන කරයි. එසේ වුව ද, එය ප්‍රමාණවත් නැත. වෙළෙඳාමේ ප්‍රතිලාභ ස්වයංක්‍රීයව ලැබෙන්නේ නැත. එහි වාසි කම්කරුවන්ට සහ පුළුල් සමාජයට යොමු කිරීම සඳහා ප්‍රතිපත්ති අවශ්‍ය වෙයි. මානව සංවර්ධනයේ දී ශ්‍රී ලංකාවට දැනටමත් ඇති ආකර්ෂණීය ප්‍රතිඵල, අධ්‍යාපනයේ දී , උෞණ සේවා නියුක්තියේ දී, දිළිඳු භාවයේ දී, සහ පෞද්ගලික ණය ලබාගැනීමේ දී, ප්‍රජාවන්ගේ අවස්ථා සම්බන්ධයෙන් පවතින ව්‍යුහාත්මක විෂමතා විසඳීම මගින්, තව දුරටත් වර්ධනය කළ හැකි ය.

යුරෝපයට සහ ශ්‍රී ලංකාවට ඇති මෙම ද්විත්ව අභියෝගය මෙම ඡායාරූප මගින් අල්ලා ගෙන ඇත්තේ ඒවා වැවිලිකර ප්‍රජා සාමාජිකයින්ගේ ජීවන අත්දැකීම් පිළිබඳව වන හෙයිනි. මෙම ප්‍රමාණයේ එකතුවක් මගින් ලබා දිය හැකි වන්නේ එයින් නියෝජනය වන විවිධ වූ ජනයාගේ සංකීර්ණ ජීවිත පිළිබඳ කුඩා කවුළුවක් වුව ද, එකතුකර ගැනීම යන්න ශ්‍රී ලංකාවට වැදගත් වන්නේ ඇයි ? යන්න පිළිබිඹු කිරීමට එයින් ම පෙළඹෙන බව අපි බලාපොරොත්තු වෙමු.

මෙම මුද්‍රණය කළ එකතුවෙහි නොමැති ඡායාරූප ඇතුළුව, ඡායාරූපවලට පෙනී සිටිමින් තම ජීවන අත්දැකීම් බෙදා ගන්නට කැමැත්ත දැක්වූ ප්‍රජා සාමාජිකයින්ට අපි ස්තුති කරන්නෙමු. මෙම රූපවලට සහ කතාවලට ප්‍රවේශ වීමට පුළුල් ප්‍රේක්ෂක පිරිසකට අවස්ථාව සැලසීම මගින් මෙම නැගී එන ඡායාරූප ශිල්පීහු තම ප්‍රජාවන්ගේ හඬ විශාලනය කරමින් සිටිති.

මෙම එකතුව යුරෝපා සංගමයේ සහ ජර්මන් ෆෙඩරල් විදේශ කාර්යාලයේත්, සම මූල්‍ය දායකත්වයෙන් යුතු ශ්‍රී ලංකාවේ සංහිඳියා ක්‍රියාවලිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියේ මුල පිරුමකි. සංහිඳියාවේ සහ සමාජ සමගියේ ප්‍රධාන අංග විසඳා ගැනීමට, ආණ්ඩුවේ, රාජ්‍ය නොවන සහ තෘණ මූල හවුල්කරුවන්ට සංහිඳියා ක්‍රියාවලිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය ආධාර කරයි. ක්‍රියාත්මක කිරීමේ හවුල්කරුවන් වන ඩොයිස්චේ ගෙසෙල්චාෆ්ට් ෆූර් ඉන්ටනසනාල් ශුසේමනාබීට් (ජී අයි ඉෂෙඩ්) ජී එම් බී එච් සහ බ්‍රිතාන්‍ය සභාවට මෙන් ම උඩරට දෙමළ ප්‍රජාවට උපදේශනය සඳහා ඔවුන් දිගට කරගෙන යන වැඩ සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ඌව ශක්ති පදනම සහ සුව ශක්ති ආයතනයටත් සුබ පතමු.

ඩෙනි ෂයිබි,
තානාපති, ශ්‍රී ලංකාවේ යුරෝපා සංගම් නියෝජිත කණ්ඩායම

# පෙරවදන

## තේ කහට ඡායාරූප පොත

ශ්‍රී ලංකාවේ සාමය ගොඩනැගීමේ කටයුතුවල නිරතවෙන්නන් අලුතින් හඳුනා ගන්නා උදවිය නිතර ම ඔවුන්ගෙන් නගන ප්‍රශ්නයක් වන්නේ “ඒ කියන්නේ ඔබ උතුරු නැගෙනහිර වැඩ කරනවා ද?” යන්න යි. කඳු රටට යොමු වූ ඡායාරූපකරණ මූල පිරුමකට සංහිඳියා වැඩ සටහනක් ආධාර කළ යුත්තේ මන්දැයි සමහරු ප්‍රශ්න කළ හැකි ය. සියලු කරුණු සැලකිල්ලට ගත්විට දශක ගණනක් පැවති ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයේ දී, උඩ රට දෙමළ ජනයා ඍජු කාර්යයක් ඉටු කළේ නැත.

කෙසේ වෙතත්, සාමය තිරසාර වීමට නම් එය සියලු දෙනා ඇතුළත් කරගන්නා එකක් විය යුතු ය. දශක ගණනාවක උද්දේශන සහ කොන් කිරීම් වලින් පසුව 21 වැනි සියවසේ දී පමණක් පුරවැසිභාවය ලබා දුන් උදවිය ඇතුළුව සියලු ප්‍රජාවන්ට ශ්‍රී ලංකාවේ සමාජයට අර්ථවත් ලෙස සහභාගී වීමේ අවස්ථාව තිබිය යුතු ය. “ධනාත්මක සාමය” ලෙස හඳුන්වනු ලබන්නේ මෙය යි. එය යුද්ධය නොමැති වීමට වඩා වැඩි දෙයකි.

මෙම අසාමාන්‍ය ඡායාරූප එකතුව තුළින් බලන විට, ශ්‍රී ලංකාවේ සංහිඳියාව සවිබල ගැන්වීමේ ක්‍රියාවලිය වැඩ සටහන තුළින් මෙම තරුණ පිරිසගේ ගමනට ආධාර දීම පිළිබඳව අපි ආඩම්බර වෙමු. එහි හවුල් ආධාර කරුවන් වූයේ යුරෝපා සංගමය සහ ජර්මන් ආණ්ඩුව යි. මෙබඳු කලා සහ සංස්කෘතික මූල පිරීම් මගින් ප්‍රජාවන් සංවාදයේ නිරත කරවීමෙන්,

සංහිඳියා සවිබල ගැන්වීමේ ක්‍රියාවලිය සහ එහි හවුල්කරුවන් ජනතාවට ආරාධනා කරන්නේ තම උපකල්පන විවේචනාත්මකව පිළිබිඹු කිරීමට සහ අභියෝගයට ලක් කිරීමටත්, පොදු ප්‍රශ්න විසඳා ගැනීමට සාමකාමී ක්‍රම භාවිතයට සහ සියලු දෙනා ඇතුළත් කරගත් ප්‍රජාවන් ගොඩ නැඟීමටත් ය.

ප්‍රජා සංවාද මුලපිරුම්වලට අමතරව, සංහිඳියා සවිබල ගැන්වීමේ ක්‍රියාවලිය, එහි පර්යේෂණ, මාධ්‍ය සහ ඓතිහාසික සංවාද වැඩ මඟින්, සංහිඳියා ප්‍රශ්න පිළිබඳව නිර්මාණාත්මක සහ හොඳින් දැනුවත් මහජන කතිකාවක් වර්ධනයත්, අතීත සහ දෛනික අභියෝගවලට මුහුණ දීමට ගැටුමේ බලපෑමට ලක් වූ ජනයාට ආධාර කිරීමේ ගුණාත්මක මනෝසමාජ ආධාර ලබාගැනීමේ අවස්ථා වර්ධනයත්, සහ පොලිස් සහ සෞඛ්‍ය සේවා වැනි ප්‍රධාන ක්ෂේත්‍රවල ද්විභාෂා සේවා ලබා දීමට රාජ්‍ය නිලධාරීන්ට ආධාර කිරීමත් සිදු කරයි.

එකතුවේ ඇති ඡායාරූපවල සංයුතිය, වර්ණ සහ විචිත්‍රවත් බවත්, එමඟින් නිරූපනය කරන දර්ශන සහ පුද්ගලයින්වත්, එමඟින් මතු කළ හැකි ධනාත්මක වූ හෝ අභියෝගාත්මක හෝ හැඟීම් සහ අදහස් ආදියත් අගය කිරීමට අපි පාඨකයන්ට ආරාධනා කරමු. ඔවුන්ගේ උපකල්පන පිළිබඳව ගැඹුරින් සිතා බැලීමේ අවස්ථාව ලබා ගන්නා ලෙසත්, සියලු ශ්‍රී ලාංකිකයින් සඳහා සාමකාමී සහ සියලුදෙනා ඇතුළත් කරගත් අනාගතයක් සඳහා දායක වීම දිරි ගැන්වීමටත් අපි පාඨකයන්ට වැඩි දුරටත් ආරාධනා කරමු.

*හොල්ගර් සේවිබර්ට්,*
ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකාවේ තානාපති

# තේ

## කෝප්පයේ රසට සැඟව ගිය කඳුළු කතාව

"ඔබ පොතක් කියවන විට, සිනමා පටයක් නරඹන විට හෝ විවේකීව ගත කරන විට තේ කෝප්පයක් රස විඳින්නේ ද? එය ඔබට කොපමණ මිහිරක්, සනීපයක් ගෙන දෙන්නේ ද? නමුත් එකී ප්‍රණීත තේ කෝප්පයේ රසයට යට වූ කඳුළු කතාව ඔබ දන්නෙහි ද? එකී තේ කෝප්පය වෙනුවෙන් වෙහෙස මහන්සි වූ සහෝදර ජනයා ගැන ඔබ මොහොතක් සිතා ඇත් ද? මේ අප ගෙනෙන්නේ, ඒ මිහිරි තේ කෝප්පයට සැඟව ගිය ඔවුන්ගේ ජීවිත පිළිබඳ කතාවයි."

කඳුකර දෙමළ ප්‍රජාව මෙරටට පැමිණි දවසේ සිට මෙරට ආර්ථිකය සුපෝෂණය කිරීමෙහිලා ලබා දෙන දායකත්වය මිල කළ නොහැකි තරමට සුවිශාල ය.

ශ්‍රී ලංකාව ලෝකයක් හඳුනන්නේ 'සිලෝන් ටී' හෙවත් ලංකා තේ නිෂ්පාදන නිසා ය. නමුත් තවම තේ දළු නෙළන, ගස් කප්පාදු කරන, පොහොර දමන සියලු නිෂ්පාදන ක්‍රියාවලියට උර දෙන කඳුකර දෙමළ ප්‍රජාව ඔවුන්ගේ ජීවිතවලින් උසස් තත්ත්වයකට පත් වී නොමැත. දේශපාලන, ආර්ථික, සමාජීය බොහෝ කාරණා අතින් ඔවුන්ට හිමි තැන තවම හිමි වී නොමැත. ඒ තැන ඔවුන්ට ලැබිය යුතු ය. වරප්‍රසාද සහිත පුරවැසි අයිතීන් දිනා ගැනීම සඳහා අවැසි ශක්තිය ඔවුන් සතු ය.

මෙම සහෝදර ප්‍රජාව වෙනුවෙන් ලියැවී ඇති කවි, ගී සහ විවිධ නිර්මාණ ද බොහෝ ය. ඒ නිර්මාණ අතුරින් සානුකම්පිත පරිකල්පනයෙන් යුතුව නිර්මාණ සේම දේශපාලන ප්‍රතිසංස්කරණ වෙනුවෙන් සමාජ පරිකල්පනය පුළුල් කිරීමට සමත් නිර්මාණ ද වන්නේ ය. මෙම ඡායාරූපවල මුඛ්‍ය අරමුණ වන්නේ ද කඳුකර දෙමළ ප්‍රජාවගේ ජන ජීවිතවල හරස්

කඩක් සමාජයට පෙන්වීම ය. එනම් ඔවුන්ගේ සමාජ, දේශපාලනික, ආර්ථික හා සංස්කෘතික ජීවිත පිළිබඳ යම් සවිඥානිකත්වයක් ලබා දෙමින් ඔවුන්ගේ ජීවන යථාර්ථය පිළිබිඹු කිරීම ය.

කඳුකර ප්‍රදේශයේ තෝරා ගත් වතුයායවල් හතරක තරුණ තරුණියන් ලබා ගත් ඡායාරූප මෙහි ඇතුළත් වේ. නුවරඑළිය දිස්ත්‍රික්කය නියෝජනය කරමින් හොලිරූඩ් සහ ලොගි වතුයායවල ද, බදුල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ඇටැම්පිටිය සහ ඌව හයිලන්ඩ්ස් වතු යායවල ද තරුණ තරුණියෝ මේ සමඟ එක් වූහ.

පුරා වසර දෙකකට ආසන්න කාලයත් තිස්සේ, වැඩමුළු කීපයක් ඔස්සේ ඡායාරූපකරණය පිළිබඳ තාක්ෂණික දැනුම ද කලාව සහ සමාජීය දේශපාලනික දැනුම ද සමාජ වෙනසක් උදෙසා ප්‍රචණ්ඩත්වයෙන් තොරව කලාව භාවිත කිරීම පිළිබඳ අවබෝධය ද ලබා ගනිමින් මෙම තරුණ පිරිස ඔවුන්ගේ ජන ජීවිත ඔවුන් විසින් ම කැමරා කාචයට හසු කරගෙන තිබේ.

මෙය පර්යේෂණාත්මක වැඩසටහනකි.

සමාජ සවිඥානිකත්වය තරුණ තරුණියන්ට ලබා දෙමින් ඔවුන්ගේ ජීවිත පිළිබඳ පවතින යථාර්ථය ගවේෂණය කිරීමක් මින් සිදු වේ. යහපත් සමාජ ජීවිතයක් උදා කර ගැනීම සඳහා අවශ්‍ය පන්නරය ලබා ගැනීමට එය හේතු වනු ඇත.

එසේ ම මෙම ඡායාරූප නරඹන ඔබට, කඳුකර දෙමළ ප්‍රජාවගේ ජීවිත දෙස තෙවන ඇසකින් නිරීක්ෂණය කිරීම ඔස්සේ සවිඥානිකත්වය ලබා ගැනීමට අවස්ථාව උදා වේ.

මෙම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා ප්‍රමුඛ දායකත්වයක් ලබා දුන්නේ කඳුකර තරුණ තරුණියන් සහ ඔවුන්ගේ ඔවුන්ගේ ප්‍රජාව ය.

ඌව ශක්ති ආයතනය සහ සුව ශක්ති ආයතනය සහෝදර ආයතන වශයෙන් මෙම ක්‍රියවලිය සඳහා අත්වැල් බැඳගත් හ. එසේ ම තරුණ ප්‍රජාව හා සම්බන්ධ වෙමින් ඔවුන්ට ඡායාරූපකරණය පිළිබඳ තාක්ෂණික දැනුම ලබා දුන්නේ ප්‍රවීණ ඡායාරූප ශිල්පීන් දෙපළක් වන අජිත් සෙනෙවිරත්න සහ නදිෂ්ක රණසිංහ යන මහත්වරු ය.

ලයනල් ගුරුගේ
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

# ඡායාරූප

## භාෂාව නිවැරදිව අල්ලා ගත් දක්ෂයින්ගේ කතාව..

මේක අමුතු කතාවක්. ඒක ලිව්වේ කඳුකරයේ හිටපු ලස්සන කෙල්ලෝ කොල්ලෝ ටිකක්. බොහෝ අය දෙමළ. සමහර අය සිංහල. කීප දෙනෙක් මුස්ලිම්.

අපට දෙමළ තේරෙන්නෙ නැහැ. ඒ අය බොහෝ දෙනෙකුට සිංහල තේරෙන්නෙ නැහැ. ඉතින් අපේ සන්ධාන භාෂාව වුණේ ඡායාරූපකරණය. පළමුව අපට සිදු වුණා, න්‍යාත්මක දැනුමෙන් ඔවුන්ව සුපෝෂණය කරන්න. ඔවුන් බොහෝ දෙනෙක් ඩිජිටල් කැමරාවක් අතින් අල්ලලා තිබුණෙ නැහැ වගේ ම ඇතමෙක් සජීවීව දැකල තිබුණෙත් නැහැ.

කැමරාවේ තාක්ෂණික පසුබිම සහ ක්‍රියාකාරීත්වය පිළිබඳ තෙදින පුහුණුවකින් පසුව ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා සැතපුම් ගණනාවක් සීතල පින්නේ, ගිනි කාෂ්ටක අව්වේ, මොර සූරන වැස්සේ ඇවිද්දේ පිටු ගණනවක් ලියන්නට හැකි තරම් හදවත්වල නලියන හැඟීම් ඡායාරූපවලට කොටු කර ගන්න. ඡායාරූපයක් නිර්මාණය කිරීම සරළ පෙනුමක් තියෙන සංකීර්ණ වැඩක් බව හැමෝටම ටිකෙන් ටික තේරෙන්න ගත්තා...

පින්තූර ගන්න ආකාරය ගැන ඇඟිල්ලෙන් අනිමින් එකින් එක කියල දෙන්න අපි උත්සාහ කළේ නැහැ. ඒ වෙනුවට ඔවුන් ලබාගත් ඡායාරූප ගැන විවිධ කතා බහ , සංවාදයන් කළා.. ඇතැම් විට අපේ දෝෂාරෝපණ එල්ල වුණා.. නමුත් ඔවුන් අප්‍රතිහිත ධෛරයෙන් නැවතත් පසුදා ප්‍රබෝධමත්ව ඡායාරූප අරගෙන පැමිණියා. විශාල ආත්ම ශක්තියක් සහ ජවසම්මන්න තරුණ පිරිසක් තමා අප සමඟ වැඩ කළේ..

අවසානයෙ කෙල්ලො කොල්ලො ටික ඡායාරූප භාෂාව නිවැරදිව අල්ල ගත්තා. ලියන්න, කතා කරන්න , අලුත් ඇහැකින් ලෝකය දිහා බලන්න පුරුදු වුණා. සමාජ ප්‍රශ්න ගැන, සමාජ වටපිටාව ගැන සවිඥානික වුණා. අවසානයේ ලෝකයට ගෙනියන්න පුළුවන් මට්ටමේ නිර්මාණ බිහි කළ හැකි ඡායාරූප ශිල්පියෙක් ඒ හැමෝම ඇතුළෙ හිටියා..

අපි කළේ ඔවුන්ව කොනිත්තපු එක විතරයි. කොනිත්තලා ඔවුන්ගෙ ඇතුළෙ ඉන්න නිර්මාණකරුවා හඳුනා ගන්න උදව් කරපු එක විතරයි.

අපට නම් මේ වැඩේ, තේ උගුරක් රස විඳින හැම මොහොතකම හිතට දැනෙන කතාවක්.

ප්‍රවීන ඡායාරූප ශිල්පී නදීෂ්ක රණසිංහ
ප්‍රවීන ඡායාරූප ශිල්පී අජිත් සෙනෙවිරත්න

# ඡායාරූප
## චාරිකාව

පිටු ගණනක් ලියා දැක්විය හැකි බොහෝ හැඟීම් විවිධ තැන්වල ඇවිද ගොස් ඔවුන් ඡායාරූපයකට කොටු කරගෙන තිබේ.

වැඩිහිටි පරම්පරාවේ ආදරය, කරුණාව - වැඩ කරන මිනිසුන්ගේ වෙහස මහන්සිය - ආදරය සතුට, දුක් සුසුම් මුසු වූ ජීවන විලාසිතා - සංස්කෘතිය -  හීන හඹා යන අධ්‍යාපනය මෙන් ම ගෞරවනීය ප්‍රජාවක ඊළඟ පරම්පරාව ඔබට මේ චාරිකාවේදී මුණ ගැසෙනු ඇත.







ඩබ්ලිව්. ටී. ධනුෂ්ක බණ්ඩාර / හොලිරූඩ් / 2020



ඥානසේකරන් කාලෙයිවානි / ඌව හයිලන්ඩ්ස් / 2020



එන්. ප්‍රියදර්ශනී / හොලිරූඩ් / 2020



ඈර්. ඇගෝස්ති / ලොයි / 2020



ටී. ශ්‍රීරංජන් / ලොබි / 2020



එස්. මණිලාගයනී / ඇටවිඹිටිය / 2020



පී. සගිදරන් / ඌව හයිලන්ඩ්ස් / 2020



අරුල්ප්‍රකාසම් අජිත්කුමාර් / ඌව හයිලන්ඩ්ස් / 2020



වඩුතන්ත්‍රිගේ අමිල නුවන් / හොලිරූඩ් / 2020



සෙල්වරාජ් අන්ජලී / හොලිරූඩ් / 2020



අරුල්ප්‍රකාසම් අජිත්කුමාර් / ඌව හයිලන්ඩ්ස් / 2020



එස්. කේතීශ්වරන් /ඌව හයිලන්ඩ්ස් / 2020







පී. සගිදරන් / ඌව හයිලන්ඩ්ස් / 2020





කදිරේෂන් සනුෂාලනී / හොලිරෑඩ් / 2020




ටී. යුවරාජන් / ලොගි / 2020



අරුල්ප්‍රකාසම් අජිත්කුමාර් / ඌව හයිලන්ඩ්ස් / 2020



එම්. සිප්ලක් / ලොයි / 2020




කදිරේෂන් සනුෂාලනී / හොලිරූඞ් / 2020



ටී. ප්‍රවරාජන් / ලොයි / 2020







ටී. ශ්‍රීහරන් / ලෙනී / 2020



ආනන්දන් ඉදයවානන් / ඇටැම්පිටිය / 2020



සුරේෂ් දුවාරහන් / හොලිරූඩ් / 2020



එම්. සින්දුජන් / ලොගි / 2020


වඩුතන්ත්‍රිගේ අමිල නුවන් / හොලිරූඩ් / 2020



සිවපෙරුමන් නිරන්ජන් / ඇටැම්පිටිය / 2020



අරුල්ප්‍රකාසම් අජිත්කුමාර් / ඌව හයිලන්ඩ්ස් / 2020

එස්. කේතීශ්වරන් / ඌව හයිලන්ඩ්ස් / 2020







පී. සගිදරන් / ඌව හයිලන්ඩ්ස් / 2020



පී. සගිදරන් / ඌව හයිලන්ඩ්ස් / 2020



පී. සගිදරන් / ඌව හයිලන්ඩ්ස් / 2020







මහාමුණි නිරෝෂන් ගයාතිරන් / ඌව හයිලන්ඩ්ස් / 2020





එල්. ඝනිලෝනාන් / ලොබී / 2020



ජේ. දුශාන්තිනි / ඇටැම්පිටිය / 2020



ඩබ්ලිව්. ටී. ධනුෂ්ක බණ්ඩාර / හොලිරූඩ් / 2020



ඩබ්ලිව්. ටී. ධනුෂ්ක බණ්ඩාර / හොලිරූඩ් / 2020



පී. සගිදරන් / ඌව හයිලන්ඩ්ස් / 2020





සෙල්වරාජ් අජිත් / ශොලිරණී / 2020



ඩබ්ලිව්. ටී. ධනුෂ්ක බණ්ඩාර / හොලිරූඩ් / 2020



සෙල්වරාජ් අෂ්විනී / හොලිරූඩ් / 2020





ජේ. දුෂාන්තිනී / ඇටැම්පිටිය / 2020



නෙත්මිණි සමුද්‍රා / ඇටැම්පිටිය/2020



ඥානසේකරන් කාලෙයිවානි / ඌව හයිලන්ඩ්ස් / 2020

එන්. ප්‍රියදර්ශනී / හොලිරූඩ් / 2020







සී. කෝකිල ප්‍රියා / ඇටැම්පිටිය / 2020



කදිරේෂන් සනුෂාලනී / හොලිරූඩ් / 2020





එම්. සිත්ලාන් / ලොයි / 2020



සිවපෙරුමන් නිරන්ජන් / ඇටැම්පිටිය / 2020



මහාමුණි නිරෝෂන් ගයාතිරන් / ඌව හයිලන්ඩ්ස් / 2020



ඩබ්ලිව්. ටී. ධනුෂ්ක බණ්ඩාර/හොලිරූඩ්/2020



ඩබ්ලිව්. ටී. ධනුෂ්ක බණ්ඩාර / හොලිරූඩ් / 2020







එස්. කේතීශ්වරන් / ඌව හයිලන්ඩ්ස් / 2020



නෙත්මිණී සමුද්‍රා / ඇටැම්පිටිය / 2020



ඩී. සසිදරන් / ටෙල් සසිලෙන්සිස් / 2020



ඩී. හෝසිල ප්‍රියා / ඇටම්පිටිය / 2020



ඥානසේකරන් කාලෙයිවානි / ඌව හයිලන්ඩ්ස් / 2020



ආනන්දන් ඉදයවානන් / ඇටැම්පිටිය / 2020



කුමාර් සුගන්යා / ඇටැම්පිටිය / 2020



අරුල්ප්‍රකාසම් අජිත්කුමාර් / ඌව හයිලන්ඩ්ස් / 2020



ඥානසේකරන් කාලෙයිවානි / ඌව හයිලන්ඩ්ස් / 2020



මහාමුණි නිරෝෂන් ගයාතිරන් / ඌව හයිලන්ඩ්ස් / 2020



ටී. යුවරාජන් / ලොගි / 2020



පී. කලෛයිච්සෙල්වි / ඇටැම්පිටිය / 2020






ටී. යුවරාජන් / ලොගි / 2020



ඥානසේකරන් කාලෙයිවානි / ඌව හයිලන්ඩ්ස් / 2020



පී. සඟිදරන් / ඌව හයිලන්ඩ්ස් / 2020



ආර්. ගෝෂලයා / හොලිරූඩ් / 2020



එස්. ශ්‍රී දේවි / ඌව හයිලන්ඩ්ස් / 2020



එස්. ශ්‍රී දේවි / ඌව හයිලන්ඩ්ස් / 2020





එස්. ශ්‍රී දේවි / ඌව හයිලන්ඩ්ස් / 2020



මහාමුණි නිරෝෂන් ගයාතිරන් / ඌව හයිලන්ඩ්ස් / 2020





ඩබ්ලිව්. ටී. ධනුෂ්ක බණ්ඩාර / හොලිරූඩ් / 2020



එස්. ශ්‍රී දේවී / ඌව හයිලන්ඩ්ස් / 2020



ඩබ්ලිව්. ටී. ධනුෂ්ක බණ්ඩාර / හොලිරූඩ් / 2020





සෙල්වරාජ් අශ්විනී / හොලිරූඩ් / 2020



ඩබ්ලිව්. ටී. ධනුෂ්ක බණ්ඩාර / හොලිරූඩ් / 2020



ඩබ්ලිව්. ටී. ධනුෂ්ක බණ්ඩාර / හොලිරූඩ් / 2020

එම්. සසිප්‍රියන් / ඌව හයිලන්ඩ්ස් / 2020







ආනන්දන් ඉදයවානන් / ඇටැම්පිටිය / 2020



ඥානසේකරන් කාලෙයිවානි / ඌව හයිලන්ඩ්ස් / 2020





එස්. ජෝතීශ්වරන් / උඩ හයිලන්ඩ්ස් / 2020



වඩුගන්ත්‍රීගේ අමිල ප්‍රසාද් / පෝට්‍රේට් / 2020




ඩබ්ලිව්. ටී. ධනුෂ්ක බණ්ඩාර / හොලිරූඩ් / 2020



ආර්. ගෝෂලයා / හොලිරූඩ් / 2020



මයිල්වාගනම් තනුෂිකා / ලොගි / 2020





එස්. ශ්‍රී දේවි / ඌව හයිලන්ඩ්ස් / 2020



කුමාර් සුගන්යා / ඇටැම්පිටිය / 2020



ආනන්දන් ඉදයවානන් / ඇටැම්පිටිය / 2020



එම්. සසිප්‍රියන් / ඌව හයිලන්ඩ්ස් / 2020



ආනන්දන් ඉදයවානන් / ඇටැම්පිටිය / 2020







ආනන්දන් ඉදයවානන් / ඇටැම්පිටිය / 2020



එස්. කේතීශ්වරන් / ඌව හයිලන්ඩ්ස් / 2020



සුරේෂ් දුවාරහන් / හොලිරූඩ් / 2020



කදිරේෂන් සනුෂාලනී / හොලිරූඩ් / 2020





එම්. සින්දුජන් / ලොගී / 2020





ටී. ශුවිරාජ් / ලොති / 2020

# තේ කහට
## සහෘද නෙත් කැල



### ඥානසේකරන් කාලෛයිවානි

මගෙ නම ඥානසේකරන් කලෛයිවානි, ඌව හයිලන්ඩ්ස් වත්ත, පැරණි කොට්ටාසයේ තමා මම පදිංචි වෙලා ඉන්නේ. ඌව හයිලන්ඩ්ස් දෙමළ මහා විද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ මම මේ වන විට අධ්‍යාපනය අවසන් කර සිටිනවා.

මේ වැඩසටහනට සම්බන්ධ වීම නිසා ඡායාරූප කලාව ඉගෙන ගන්න වගේ ම විවිධ ඡායාරූප ලබා ගැනීමේ අවස්ථාව ලැබුණා. එසේ ම කඳුකර ප්‍රදේශයේ විවිධ වතුවල සැරිසැරීම නිසා අපේ ජනතාව මුහුණ දෙන ගැටලු පිළිබඳව ගැඹුරු අවබෝධයක් ලැබුණා. ඩිජිටල් කැමරාවක් කියන්නේ මොකක්ද, එය භාවිත කරන්නේ කොහොමද කියල කිසිම අවබෝධයක් නොවූ මට අවසානයේ එය මනාව හැසිරවීමේ හැකියාව ලැබුණා. මුල් කාලයේ මම ගත්තු ෆොටෝ තනිකරම සුදු පාටයි. පසුව මට සාධනීය මට්ටමේ ඡායාරූපයක් ගන්න පුළුවන් වුණා. ලෝක පූජිත ඡායාරූප

ශිල්පීන්ගේ ඡායාරූප නැරඹීමත් ඒ සඳහා මනා පිටිවහලක් වුණා. මෙම ඡායාරූප ප්‍රදර්ශනය ඔස්සේ කඳුකර සමාජයේ ජන ජීවිත රූපගත කිරීමට මෙන්ම ඒවා ඉස්මතු කරමින් සමාජගත කිරීමට අවස්ථාව හිමි වීම වටිනා අවස්ථාවක් හැටියටයි මා දකින්නේ.

## ආනන්දන් ඉදයවානන්



ඇටැම්පිටිය දෙවන කොටසේ ජීවත්වන මම ඌව හයිලන්ඩ්ස් දෙමළ මහා විද්‍යාලයේ අධ්‍යාපනය හදාරනවා. කුඩා කාලයේ සිට ඡායාරූපකරණය පිළිබඳ ඉගෙනීමට ආසාවක් තිබුණත් අවස්ථාවක් හිමි වුණේ නැහැ. කෙසේ හෝ අවසානයේ මේ වැඩසටහන සමඟ සම්බන්ධ වීමට අවස්ථාව ලැබුණා.

මෙහිදී හුදෙක්ම ඡායාරූප ගැනීම පමණක් නෙමේ, වතුකරයේ සුන්දරත්වයට එපිටින් තිබෙන දෙමළ සමාජයේ ජීවන ක්‍රමය සහ ගැටලු පිළිබඳ ඉගෙන ගැනීමට අවස්ථාවක් හිමි වුණා. විවිධ වතුවලට ගිහින් ඔවුන් මුහුණ පාන ගැටලු පිළිබඳ අසා දැන ගැනීමට පුළුවන් වුණා. වසර ගණනක් ගත වුණත් ඔවුන්ගේ ජීවිත කිසිම වෙනසක් ඇති නොවී කසල ගොඩකට වැටුණ කුණ්ඩුමනි ඇටයක් වැනි ජීවිත ගතකරමින් සිටින බව ඒත්තු ගියා. එම ජීවිත සහ ඔවුන්ගේ සංස්කෘතිය බාහිර ලෝකයට පෙන්වීමට තිබෙන එක් අවස්ථාවක් හැටියට මේ ඡායාරූප හඳුන්වා දෙන්න පුළුවන්.

## මහාවුණි නිරෝෂන් ගයාතිරන්



ඌව හයිලන්ඩ්ස් මහා විද්‍යාලයේ උසස් පෙළ හදාරන මම ඌව හයිලන්ඩ් දෙවන කොටසේ ජීවත් වෙනවා. ඡායාරූප ඔස්සේ සමාජයීය ගැටලු, විවිධ සංස්කෘතීන්, සදාචාර හා සාරධර්මයන් බාහිර ලෝකයට ගෙනියන්නේ කොහොමද යන්න අපි ඉගෙන ගත්තා. මෙම ඡායාරූපකරණයේ අපේ ප්‍රධාන අරමුණ වන්නේ වතුකර ජනතාවගේ සමාජීය, දේශපාලන, ආර්ථික හා සංස්කෘතික කරුණු බාහිර ලෝකයට සන්නිවේදනය කිරීමයි. එමගින් ඔවුන්ගේ ගැටලුවලට විසඳුම් කරා යෑමට අවස්ථාවක් උදාකර ගැනීමයි.

සමාජ වගකීමක් සහිත ඡායාරූප ශිල්පියෙකු වශයෙන් අපේ ජනතාව මුහුණ දෙන ගැටලු කලාව ඔස්සේ සන්නිවේදනය කරමින් ඒවාට විසඳුම් සෙවීම සඳහා මැදිහත් වන්නට ලැබුණ අවස්ථාව ගැන වතුකරයේ තරුණයෙක් හැටියට මම සතුටු වෙනවා.

## එස්. කේතීශ්වරන්



මම ඌව හයිලන්ඩ් දෙමළ මහා විද්‍යාලයෙන් සාමාන්‍ය පෙළ විභාගයට සාර්ථකව මුහුණ දී එම විද්‍යාලයේ ම උසස් පෙළ සඳහා වාණිජ විෂය තෝරාගෙන අධ්‍යාපන කටයුතු හමාර කළා. මගේ තාත්තා එළවළු වෙළඳාම රැකියාව වශයෙන් කරන අතර අම්මා ගෘහණියක්. පොඩිකාලේ ඉඳල මම දක්ෂ වුණේ ක්‍රිකට් ක්‍රීඩාවට. මම ක්‍රිකට් ක්‍රීඩාවෙන් පාසල් සහ පළාත් මට්ටමේ විවිධ ජයග්‍රහණ ලබා ගෙන තිබෙනවා. බදුල්ලේ ක්‍රිකට් පුහුණුවීම් කරමින් ඉන්නකොට තමා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ මෙම ඡායාරූප සම්බන්ධ වැඩසටහන කරනවා කියලා ඌව ශක්ති ආයතන හරහා දැන ගත්තේ.

මෙම වැඩසටහන නිසා ඡායාරූපකරණය වගේ ම මම ජීවිතයට වැදගත් වන අපූරු දේවල් බොහොමයක් ඉගෙන ගත්තා. එසේම


මගේ අනාගත ජීවිතයේ අඩිතාලම සකස් කර ගැනීමේ අවස්ථාව හිමි වුණා.



## ජේ. දූෂාන්තිනී

ඇටැම්පිටිය දෙවන කොටසේ ජීවත් වන මම චිත්‍ර ඇඳීම, ගී ගැයීම සහ කවි ලිවීම විනෝදාංශ වශයෙන් කරමින් එකී දක්‍ෂතා ප්‍රගුණ කරමින් ඉන්න විටයි මේ ඡායාරූප වැඩසටහන සමඟ සම්බන්ධ වෙන්න අවස්ථාව හිමි වුණේ. මම බණ්ඩාරවෙල විවේකානන්ද දෙමළ මහා විද්‍යාලයේ කලා අංශයෙන් උසස් පෙළ හදාරනවා.

මා තුළ කොතරම් දක්ක්‍ෂතාවන් තිබුණත් මම නිවසේ බිත්ති හතරට කොටු වී සිටි අයෙක්. මෙම වැඩසටහන සමඟ සම්බන්ධ වීමට අවස්ථාව ලැබුණ නිසා මගේ දක්‍ෂතා තවදුරටත් අනෙක් අය සමඟ බෙදා ගන්න පුළුවන් වුණා. මට අද ඡායාරූප ගැනීමටත් ඒ පිළිබඳ මගේ අදහස් නොබියව ප්‍රකාශ කිරීමටත් හැකියාව ලැබුණේ මේ වැඩසටහනට සම්බන්ධ වී මා ලැබූ පරිචය නිසා. ස්වභාධර්මය දෙස බලා ඒ පිළිබඳ මිමිනූ සුන්දර වදන් අද වන විට වෙනස් අයුරකින් කතාන්දර කීමේ තත්ත්වයකට පත් කළේ ඡායාරූප කලාව මගින්. හොඳින් අධ්‍යාපනය හදාරන ගමන් ඡායාරූප කලාව ආශ්‍රිත ගමනක් යෑමට මම අදහස් කරනවා.



## සිවපෙරුමන් නිරන්ජන්

ඇටැම්පිටිය 1 කොටසේ ජීවත්වන මා අධ්‍යාපනය හදාරන්නේ බණ්ඩාරවෙල විවේකානන්ද දෙමළ මහා විද්‍යාලයේ. මා සිතා සිටියේ ඡායාරූප කලාව යනු ගස් කොළන්, සත්තු, කඳු, දිය ඇලි ආදී ස්වාභාවික සුන්දරත්වය ගැනීම පමණක් බවයි. නමුත් මේ වැඩසටහන සමඟ සම්බන්ධ වුණාම මට අවබෝධයක් ලැබුණා ඡායාරූප කියන්නේ ස්වාභාවික සුන්දරත්වය රූපයට හසු කර

ගැනීම පමණක් නොව ඊට වඩා බොහෝ පුළුල් විෂයක් බව. ඡායාරූපකරණය ගැන මූලික තාක්ෂණික දැනුම මට මේ ඔස්සේ ලබා ගැනීමට හැකි වුණා.

'එළිය නොවැටෙන රාත්‍රිය කියා කිසිවක් නොමැත, අවසානයක් නැති කිසිම දුකක් නැත, බැස නොයන ගංවතුරක් නොමැත, ජීවත් නොවන ජීවිතයක් කියා නොමැත' ආදී වශයෙන් වෛරමුත්තු නම් කවියාගේ පද තුළ ඇති ගැඹුරු යථාර්ථය මෙන් අපට ඉටු කළ නොහැකි කිසිම දෙයක් නැත.



## ආර්. ගෝෂල්‍යා

නු/වටගොඩ දෙමළ මහා විද්‍යාලයේ අධ්‍යාපනය හදාරන මා ජීවත්වන්නේ හොලිරූඩ් පහළ කොටසේ ය. මා කුඩා කල සිතා සිටියේ ඡායාරූප කලාව යනු පහසුවෙන් ඉගෙනගත හැකි දෙයක් කියායි. නමුත් මේ වැඩසටහන සමඟ සම්බන්ධ වීමෙන් තමයි මම මේ ගැන ක්‍රමානුකූල අවබෝධයක් ලබා ගත්තේ. එසේම ඡායාරූපවලට අමතරව ජීවිතයට සහ අනාගතයට ප්‍රයෝනවත් බොහෝ දෑ ඉගෙන ගත්තා.



## පී. සගිදරන්

බදුල්ල මොරගොල්ල ප්‍රදේශයේ ජීවත්වන මා අධ්‍යාපනය ලැබුවේ මොරගොල්ල දෙමළ මහා විද්‍යාලයෙන්. පාසල් අධ්‍යාපනයෙන් පස්සේ විවිධ වෘත්තීය පුහුණුවල නිරත වුණත් පසුව මම සියල්ල අතැර දමා නිවස මුල්ලට වී සිටියා. හිටිහැටියේ මිතුරියකගෙන් ලැබුණ පණිවිඩයටකට අනුව තමයි මෙම ඡායාරූපකරණය සම්බන්ධ වැඩසටහන සමඟ මම එකතු වුණේ.

මේ වැඩසටහනට එකතු වුණාම ඡායාරූපකරණය ඉගෙන ගෙන වඩාත් හොඳ ඡායාරූප ගැනීමටත් ඒ පිළිබඳ දක්ෂ ලෙස අදහස් ඉදිරිපත් කිරීමටත් හැකියාව ලැබුණා. ඒ අනුව මා තුළ බොහෝ වෙනස්කම් සිදු වුණා. එසේම වතුකරයේ ජනතාව පිළිබඳ කියා පාන ඡායාරූප ගැනීමට මා පෙළඹුණා. මේ වනතුරු සමාජය ඉස්සරහා හිස පහත්කරගෙන ජීවත් වුණ මා දැන් මේ වැඩසටහනෙන් පසු හිස කෙළින් තියාගෙන ජීවත්වන මට්ටමට සංවර්ධනය වුණා.



## කදිරේෂන් සනුෂාලිනී

තලවකැලේ රත්නීලගල ප්‍රදේශයේ ජීවත්වන මා තලවකැලේ දෙමළ මහා විද්‍යාලයෙන් කලා අංශයෙන් උසස් පෙළ හදාරමින් සිටින අතර මාධ්‍ය ක්ෂේත්‍රයේ නිවේදිකාවක් වීම අනාගත අපේක්ෂාවයි. දැනටමත් මාධ්‍ය ක්ෂේත්‍රයේ විවිධ වැඩසටහන්වලට සම්බන්ධ වී සිටිනවා. මෙම වැඩසටහනට සම්බන්ධ වීමෙන් පසු බොහෝ ඡායාරූප ලබා ගත් අතර ඒවා ප්‍රදර්ශනය සඳහා ද තෝරා ගත්තා. ඡායාරූප කලාව සියලු දෙනා ප්‍රියකරන ශිල්පයක්. මා තුළ ද මේ පිළිබඳ ආශාවක් තිබෙනවා. කඳුකරයේ යොවුන් තරුණියක් විදියට ඡායාරූප ශිල්පිනියක් වීමට අවස්ථාව ලැබීම පිළිබඳ මා සතුටු වෙනවා.



## පී. කලෙයිච්සෙල්වි

බදුල්ල විවේකානන්ද දෙමළ මහා විද්‍යාලයෙන් සහ ඌව හියිලන්ඩ්ස් දෙමළ මහා විද්‍යාලයෙන් අධ්‍යාපනය හැදෑරූ මම උසස් පෙළ අධ්‍යාපනයෙන් පස්සේ මෙම ඡායාරූප වැඩසටහන සමඟ එකතු වුණා. මුල් කාලයේ ඡායාරූප කලාව පිළිබඳ කිසිම දැනුමක් තිබුණේ නැහැ. නමුත් මෙහි ඡායාරූපකරණය පිළිබඳ උපදේශකවරුන්ගේ පමඟපෙන්වීම යටතේ තාක්ෂණික කාරණා

මනාව හසුරුවමින් ඡායාරූපයක් ගන්න විදිය සහ ඡායාරූප ඔස්සේ කතන්දරයක් කියන්නේ කොහොමද කියලා මම ඉගෙන ගත්තා. ඒ වගේම විවිධ වතු සහ ගම්මානවලට ඡායාරූප ගැනීම සඳහා යෑමට අවස්ථාව හිමි වීමත් සමඟ මා නොදන්නා බොහෝ දේ ගැන දැන ගැනීමට අවස්ථාව ලැබුණා.

අනිත් විශේෂම කාරණය තමයි වතු සමාජයේ මෙතෙක් නොදත් බොහෝ දේ පිළිබඳ සවිඥානිකත්වය ලබා ගැනීමට හැකි වීම. මෙම ක්‍රියාවලියේ දී අප ඉගෙනගත් තවත් වැදගත් දෙයක් තමා අපගේ වතු සමාජය දැනුවත් භාවයකින් යුතු සමාජයක් බවට පත් කරන්නේ කොහොමද කියන එක. මේ ඡායාරූප ඔස්සේ ද අපි සිදු කරන්නේ ඒ ක්‍රියාවලියයි. ඡායාරූප කලාව මගේ ජීවිත කාලය පුරා අඛණ්ඩව පවත්වාගෙන යන බව මට විශ්වාසයි.



## එස්. ශ්‍රී දේවි

ඌව හයිලන්ඩ්ස් නැමති සුන්දර වතුයායේ ජීවත් වන මම ඌව හයිලන්ඩ්ස් මහා විද්‍යාලයේ කුඩාකල සිට උසස් පෙළ දක්වා අධ්‍යාපනය හැදෑරුවා. උසස් අධ්‍යාපනය වෙනුවෙන් වාණිජ්‍යවේදී බාහිර උපාධිය හැදෑරූ මම තව දුරටත් මගේ ගුරු පුහුණුව අඩ්ඩාලච්චේන රජයේ ගුරු පාසලෙන් ලබා ගත්තා. මම දැනට සේවය කරන්නෙත් මා ඉගෙනුම ලැබූ ඌව හයිලන්ඩ් විද්‍යාලයේමයි.

පාසලේදී ක්‍රීඩා, විෂය සමගාමී ක්‍රියාකරකම්, බලදක්ෂ, ප්‍රථමාධාර සහ තරුණ සේවා සභාවේ විවිධ වැඩසටහන්වල සහ කලා සංස්කෘතික ක්‍රියාකාරකම්වලද නියැලෙමින් සමාජ සේවා කටයුතු සඳහා ද පූර්ණ දායකත්වය ලබා දුන්නා. නිරන්තරව අලුත් යමක් ඉගෙන ගැනීමේ මගේ උනන්දුව වැඩි කළේ මෙම වැඩසටහනයි.

ඡායාරූප ඔස්සේ ජාති, ආගම්, භාෂාව හා කුල භේදයකින් තොරව ඕනෑම කෙනෙක් තුළ යම් පිබිදීමක් ඇති කරන්න පුළුවන්.

සමාජ පරිවර්තනයක් උදෙසා ඡායාරූප කලාව ඉගෙන ගැනීම මාගේ ජීවිතේ ලැබූ විශිෂ්ට අත්දැකීමක්. ඡායාරූප මඟින් අලුත් ලෝකයක් සඳහා සංවාදයක් ඇති කළ හැකියි. ඒ තරම් ශක්තියක් ඡායාරූපවලට තියෙනවා. සමාජමය වෙනසක් ඇති කිරීම සඳහා කලාව භාවිත කිරීම සම්බන්ධයෙන් ඡායාරූපකරණය ගැන ඉගෙන ගැනීම වතුකරයේ විප්ලවය වෙනුවෙන් දමනු ලැබූ බීජයක් කියා මම හිතනවා.



## අරුල් ප්රෙකාසම් අජිත්කුමාර්

මම ජීවත් වන්නේ බණ්ඩාරවෙල එල්ලාවලෙයි වත්තේ. මම හිතනවා ඡායාරූප කලාව ඔස්සේ අපේ ප්‍රදේශවල ජීවත්වන මිනිසුන්ගේ ජීවන ක්‍රමය, ඔවුන්ගේ වේදනාව සමාජගත කිරීම ඔස්සේ ඔවුන්ගේ ජීවන ක්‍රමය යහපත් වෙනසක් ඇති කිරීම සඳහා යමක් කළ හැකිය කියලා. එසේ ම සමාජය සහ තරුණ අප අතර තිබුණ දුරස්ථභාවය හඳුනා ගැනීමට අවස්ථාව ලැබීම, ඡායාරූප ඔස්සේ වතු ප්‍රජාවගේ ප්‍රශ්න සංවාදයට ගැනීමට හැකි වීම වැනි දේවල් ගැන සතුටු වෙන්න පුළුවන්.



## සී. කෝකිල ප්‍රියා

කඳුගැට සහ හරිත වර්ණයෙන් යුතු රෝබේරි ප්‍රදේශය මා උපන් ගම්මානයයි. ඌව හයිලන්ඩ්ස් මහා විද්‍යාලයෙන් උසස් පෙළ හැදෑරීමෙන් අනතුරුව නැගෙනහිර විශ්වවිද්‍යාලයේ කලා පීඨයේ උපාධිය හැදෑරීමට අවස්ථාව ලැබීම පිළිබඳ මා සතුටු වෙනවා. මා උසස් පෙළ හදාරා නිවසට වී සිටින කාලයේ දී තමා මෙම අපූරු වැඩසටහන සමඟ සම්බන්ධ වුණේ. භාෂාවක් නොමැතිව ඡායාරූප විසින් බොහෝ දේ කතා කරනවා. එය මොන තරම් හැඟුම් බරද? මොන තරම් අර්ථසම්පන්නද? කොපමණ ප්‍රශ්න විසඳන්නේද? කොපමණ පිළිතුරු සපයන්නේ ද? ඡායාරූප ඔස්සේ බොහෝ දේ ගැන කතා කළ හැකියි.



## එස්. මණිලානයාගි

බදුල්ල විවේකානන්ද විද්‍යාලයේ සහ ඌව හයිලන්ඩ් විද්‍යාලවලින් අධ්‍යාපනය හැදෑරූ මම මේ වන විට *VTA* ග්‍රැෆික් ඩිසයින් පාඨමාලාව හාදාරමින් සිටිනවා. සංගීතය ඇසීම, මල් සිටුවීම සහ ගමේ තරුණ සංගම් හා එක්ව සමාජ සේවාවන්හි නිරතවීම මගේ විනෝදාංශය වුණා.

ඡායාරූප යනු කුමක්දැයි කියාවත් අවබෝධයක් නොමැතිව සිටින විට මේ වැඩසටහන සමඟ සම්බන්ධ වීම ඔස්සේ බොහෝ දේ ඉගෙන ගත්තා. එමගින් සමාජයේ පරිවර්තනයක් කරන්න පුළුවන් කියලත් අවබෝධ වුණා.

ඡායාරූප කලාව ඔස්සේ අප සමාජයෙහි තිබෙන බොහෝ ගැටලු මතු කර පෙන්වීමේ අවස්ථාව ලැබුණා.



## සුන්දරරාජ් ශාන්තිනිප්‍රියා

මුල් අවස්ථාවේදී ඡායාරූප කලාව පහසු දෙයක් විදියටයි මට දැනුණේ. පුහුණු සැසිවලදී විවිධ මාර්තෘකා යටතේ ඉගෙන ගන්න කොට තමයි තේරුම් ගියේ මෙය අසීරු කාර්යයක් බව. නමුත් ඡායාරූප ගන්නා හැම අවස්ථාවකදීම ඒ පිළිබඳ දැනුම වැඩි වුණා. ඡායාරූප වගේම වතුකර සමාජය ගැනත් මෙහිදී අප ඉගෙන ගත්තා. ඡායාරූප ක්ෂේත්‍රයේ ගමනක් යෑම සඳහා අද වන විට මා මනා දැනුමක් ලබා සිටිනවා.

## සුරේෂ් දුවාකරන්



ඡායාරූප ගැනීමට මා තුළ උනන්දුවක් තිබුණත් කැමරාවක් භාවිත කරන්නේ කොහොමද කියල දැනගෙන හිටියේ නැහැ. මේ වැඩසටහනෙන් අනතුරුව කැමරාවකින් ෆොටෝ ගන්න හැටිත් කලාවක් විදියට මෙය භාවිත කරන ආකාරය ගැනත් ඉගෙන ගත්තා. උසස් පෙළ අවසන් කිරීමෙන් පසුව ඡායාරූප ශිල්පියෙකු වශයෙන් කටයුතු කරන්න ඕන කියලයි මම හිතාගෙන ඉන්නේ.

## එම්. සසිප්‍රියන්



ඌව හයිලන්ඩ් මහා විද්‍යාලයේ උසස් පෙළ සඳහා ගිණුම්කරණය හදාරනවා. ක්‍රිකට්, කබඩි, එල්ලේ වගේ ක්‍රීඩාවන් ගැනත් මම ගොඩක් උනන්දුයි. මේ වැඩසටහනට එකතු වී බොහෝ දේ ඉගෙන ගත්තා. අපිට ඡායාරූප ශිල්පීන් වශයෙන් අපේ සමාජයේ පිළිගැනීමක් පවා ඇතිවලා තියෙනවා. නිකන්ම ෆොටෝ ගැනීම නෙමේ කතා කරන ඡායාරූපයක් ගැනීම ඔස්සේ අප වතු සමාජයේ කතාව එළියට කියන්න පුළුවන්. මේ ඔස්සේවත් වතුකර ජනතාවට යහපත් ජීවිතයක් සඳහා මාර්ගයක් හැදෙනු ඇතැයි මා හිතනවා.

## සෙල්වරාජ් අෂ්විනි



හැටන් කාර්ෆෙක්ස් දෙමළ මහා විද්‍යාලයෙන් උසස් පෙළ හැදෑරීමෙන් අනතුරුව සර්වෝදය පෙර පාසලේ සේවය කළ අතර සර්වෝදය ආයතනයේ සමාජිකාවක් ලෙස කටයුතු කළා. දැන් සුව ශක්ති ආයතනයේ වැඩ කරමින් සිටින අතර නුවරඑළිය දිස්ත්‍රික් මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථානයේ ද සේවය කරනවා.

මගේ අනාගත ඉලක්කය වුණේ නීතිඥයෙකු වීමයි. විභාග ප්‍රතිඵල ඊට ප්‍රමාණවත් නොවුණ නිසා මාධ්‍ය ක්ෂේත්‍රයට නැඹුරු වුණා. නමුත්

අවස්ථාවක් ලැබුණේ නැහැ. මෙම ඡායාරූපකරණ පාඨමාලාවට සම්බන්ධීම ඔස්සේ මාධ්‍ය ක්ෂේත්‍රයට පිවිසීම සඳහා අවස්ථාවක් හිමිවෙලා තිබෙනවා. එසේම වගකීම්සහගත පුරවැසියෙකු වශයෙන් අපේ සමාජය තුළ තිබෙන සැඟවුණු බොහෝ දේ සමාජයට සන්නිවේදනය කිරීමට අවස්ථාවක් ලැබුණා.

## නෙත්මිණී සමුද්‍රා



මම බදුල්ල විහාරමහාදේවී බාලිකා විද්‍යාලයේ කලා අංශයෙන් අධ්‍යාපනය හදාරනවා. මම කඳුකර ජනයාගේ විවිධ ගැටලු ගැන අවබෝධයක් ලබා ගත්තේ මේ වැඩසටහනට සම්බන්ධවීමෙන්. කඳුකර සමාජය ගැන මගේ දැනුම පුළුල් වුණා. එසේ ඡායාරූප ඔස්සේ එකී ගැටලු සමාජ ගත කරමින් ඔවුන්ගේ ජීවිත ගැන අලුත් සංවාදයක් ඇති කරන්න පුළුවන් කියලා දැන ගත්තා.


මුල් කාලයේ මට ඡායාරූප ගැනීමේ කිසිම හැකියාවත් තිබුණෙ නැහැ. නමුත් දැන් මම මේ කලාව ප්‍රගුණ කරමින් ඉන්නවා. මගේ ජීවිතයේ ප්‍රධාන අංගයක් වශයෙන් ඡායාරූප කලාව කරගෙන යෑමට මම බලාපොරොත්තු වෙනවා.

## එම්. සින්දුජන්



විවිධ පොත් කියැවීම, චිත්‍රපට බැලීම සහ චිත්‍රපට ලිවීම මගේ විනෝදාංශය වශයෙන් කරගෙන ගියා. ඡායාරූප කලාව ගැනත් මට උනන්දුවක් තිබුණා. මම මීට පෙර ඡායාරූප අරගෙන තිබුණත් ඡායාරූප කලාව සහ කැමරාව ගැන ප්‍රමාණවත් දැනුමක් තිබුණේ නැහැ. මෙම වැඩසටහනට සම්බන්ධවීමෙන් තමා ප්‍රමාණවත් දැනුමත් ලබා ගත්තේ. ඡායාරූප කලාව ගැන තවත් ඉගෙන ගන්න බොහෝ දේ තිබෙනවා. මේ පිළිබඳව මගේ ගවේෂණය තව දුරටත් වැඩි වෙනවා මිසක් අඩු වන්නේ නැහැ.

## එන්. ප්‍රියදර්ශනී



මේ වකවානුවේදී ඡායාරූප කලාව කෙරෙහි ජනතාවගේ උනන්දුව සහ සහභාගීත්වය  ඉතා ඉහළ මට්ටමක් පවතනවා. නූතන යුගයේ දී යුවතියන් අතරත් නොයෙකුත් කලාවන් කෙරෙහි නැඹුරුවක් තිබෙනවා. ඡායාරූප කලාව සමාජයේ පවතින බොහෝ ප්‍රශ්න, අදහස් ඉතා පැහැදිලි ලෙස ජනතාව අතරට ගෙන යෑමට උපකාරී වෙනවා. මෙම වැඩසටහනේ දී ඡායාරූප කලාව පිළිබඳ දැනුම පමණක් නොව ජීවිතයට වැදගත් වන බොහෝ දේ පවා ඉගෙන ගැනීමට හැකි වුණා.

## මයිල්වාගනම් තනුෂිකා



තලවකැලේ ලොගි ඩිවිෂන්, කූම්වුඩ් වත්තේ මම ජීවත් වෙනවා. සිදුවෙමින් පවතින දේ වර්ණවත් කර ඡායාරූප කලාවට සහභාගී වූ ගමනේ දී - ගොඩ බිම සිට පිටත් වූ යාත්‍රාවක් මෙන් වසරක් තිස්සේ යෙදුණු මේ ගමනේ දී දහසකුත් දේ ගැන මම ඉගෙන ගත්තා. සැඟවී තිබූ මායාවන් දිව්‍ය ලෝකයේ ව්‍යාප්ත කරවීමේ ආයුධ දෑත දරා ගමින් ගමට ගොස් බොහෝ ඡායාරූප ගත්තා.

## වී. යුවරාජන්



තලවකැලේ ලොගි වත්තේ ජීවත්වන මම ලයිම් නිවසක සාමාන්‍ය පවුලක තරුණයෙක්. වතුකරයේ බොහෝ ප්‍රශ්නවලට මා මුහුණ දී තිබෙනවා. ජීවිතේ ඉටුකර ගත නොහැකි ඇතැම් දේ ගැන මගේ ආශාවන් පැවතුණ අතර ඡායාරූපකරණය ඉන් ප්‍රධාන විෂයයක්.

නමුත් ඡායාරූප කලාව ඉගෙන ගැනීමට මුදල් තිබුණේ නැහැ. නමුත් මම කෙටි චිත්‍රපට නිර්මාණය කිරීමට පෙළඹුණා. දැනට කෙටි චිත්‍රපට කීපයක්ම ලියා අධ්‍යක්ෂණය කොට තිබෙනවා. අහම්බෙන් මා මෙම වැඩසටහනට යොමු වීම නිසා මගේ ජීවිතේ

එක් බලාපොරොත්තුවක් වූ ඡායාරූපකරණය ගැන ඉගෙන ගැනීමට හැකි වුණා. එය මගේ චිත්‍රපට නිර්මාණය කිරීමේ කාර්යයට ද ලොකු දායකත්වයක්. මගේ අනාගත ප්‍රධාන ඉලක්කය වන්නේ දක්ෂ ඡායාරූප ශිල්පියෙකු වශයෙන් අප සමාජයේ මෙන් ම වෙනත් සමාජවල පවතින ගැටලු, ඡායාරූප කලාව ඔස්සේ මතුකර දැක්වීමයි.

## කුමාරි සුගන්යා



බදුල්ල බණ්ඩාරවෙල විද්‍යාලයේ ඉගෙනුම ලබූ මම ඇටම්පිටිය දෙවන කොටසේ පදිංචිව සිටිනවා. මගේ විශාලතම සිහිනයක් වන්නේ මා නියෝජනය කරන සමාජයේ වෙනසක් ඇති කිරීම සඳහා කාන්තාවක් වශයෙන් මගේ දායකත්වය හිමි කර දීමයි. මගේ සමාජය දෙස බලන විට අපේ සමාජයේ බොහෝ දෙනා හමුවේ ඇත්තේ අසීමිත ගැටලු පමණයි. නමුත් වගකිව යුත්තන් මේවාට අවධානය යොමු නොකිරීම කණගාටුදායක කාරණයක්. මේ ගැටලු සමාජයට පෙන්වීමට මඟක් හොයමින් සිටින මොහොතේ තමයි මා මේ ඡායාරූප වැඩසටහන සමඟ සම්බන්ධ වන්නේ.

දැන් අපේ සමාජය මුහුණ දෙන විවිධ ප්‍රශ්නවලට පසුගාමීත්වයකින් තොරව විවෘතව හා කඩිනමින් විසඳුම් ලබා ගැනීම සඳහා සමාජ සවිඥානිකත්වය ඇති කිරීමට මට ඡායාරූප කලාව භාවිත කරන්න පුළුවන්.

## ටී.ඩබ්. ධනුෂ්ක බණ්ඩාර



තලවකැලේ හොලිරූඩ් වතුයායේ ජීවත් වන මම නුවරඑළිය සුමන ද්විතීක පාසලෙන් අධ්‍යාපනය ලබා ගත්තා. ඡායාරූපකරණය පිළිබඳ මූලික අදහසක් තිබුණත් මේ වැඩසටහනට සම්බන්ධ වීමෙන් පසුව තමයි පුළුල් අවබෝධයක් ලබා ගත්තේ. එසේ ම ඡායාරූපකරණය ඔස්සේ අදහස් පැවසීම හා සමාජයට යමක් සන්නිවේදනය කරන කතා කරන ඡායාරූපයක් ලබා ගන්නේ

කොහොමද කියන දැනුම ලැබුණා. ඡායාරූප කියන්නේ ඕනෑම කෙනෙකුට තේරුම් ගන්න පුළුවන් භාෂාවක්. වෘත්තීය මට්ටමින් ඡායාරූපකරණයේ නියැලීමට හා මා ජීවත්වන සමාජය වෙනුවෙන් කළ හැකි උපරිම සේවාවක් කිරීමට බලාපොරොත්තු වෙනවා.



## වඩුතන්ත්‍රිගේ අමිල නුවන්

තලවකැලේ හොලිරූඩ් නැගෙනහිර කොටසේ තමා මම ජීවත් වන්නේ. සුමන ද්විතීයික පාසලෙන් අධ්‍යාපනය හදාරන අතර මම මේ වැඩසටහනට සම්බන්ධ වුණා. ඡායාරූපකරණය කියන්නේ තමන්ගේ ඇසින් දකින දේ ඊටත් වඩා හොඳින් අධ්‍යනය කර ප්‍රතිනිර්මාණය කිරීමක් කියල මම ඉගෙන ගත්තේ මේ වැඩසටහනින්. ඒ වගේම අප ප්‍රදේශවල ජීවත්වන දෙමළ ප්‍රජාවගේ ජන ජීවිතය පිළිබඳ පුළුල් දැනුමක් ලබා ගැනීමෙන් පස්සේ, ඒවා මේ ඡායාරූප ඔස්සේ සමාජයට කියන්න පුළුවන් වුණා. මම හිතනවා මේ ජනතාවගේ ගැටලුවලට විසඳුම් ලැබීමට මේ ඔස්සේ ඉඩ තිබෙනවා කියලා. ඒ වගේම අපිට බොහෝ අත්දැකීම් ලැබුණා. කණ්ඩායමක් හැටියට වැඩ කරන විදිය විවිධ අභියෝගවලට මුහුණ දෙන ආකාරය, ආදී ජීවිතවලට වැදගත් දේවල් ප්‍රමාණයකුත් අපිට ලැබුණා.

# තේ කහට
## ගැන වචනයක් දෙකක්

2020 සැප්තැම්බර් 26 වන දින කොළඹ ලයනල් වෙන්ඩ්ට් කලාගාරයේදී විවෘත වුණු 'තේ කහට' ලෙස ලෙස නම් කර කර තිබූ ඡායාරූප ප්‍රදර්ශනය මගින් කඳුකරයේ තරුණ තරුණියන් 40 දෙනෙකු විසින් ඉදිරිපත් කරනු ලබන ඡායාරූප සියයක් ප්‍රදර්ශනය කරන ලදී.

ඡායාරූප එකතුව සමස්තයක් ලෙස ගත් විට, එමගින් ගොතා තිබුණේ ලංකාවේ කඳුකර ප්‍රදේශ ආශ්‍රිත තේ වතුවල රැකියා කරන හා එහි ජීවත්වන දමිළ ප්‍රජාවගේ දෛනික ජීවිතය පිළිබඳ කතාවකි. එය එම ප්‍රදේශ වෙත පිටතින් ගිය පර්යේෂකයන් හෝ එවන් අන් වෘත්තිකයින් විසින් කියන කතාවක් නොවේ. මේ කතාව කියනු ලබන්නේ, මේ වතුකර ප්‍රදේශයේම ජීවත්වන තරුණ තරුණියන් පිරිසක් විසින්ය. වෙනත් වචනවලින් කියන්නේ නම්, ඔවුන් මේ කියන්නේ තමන් හොඳින් දන්නා, තමන්ගේ ජීවිත කතාවයි. මගේ විශ්වාසය වන්නේ, මේ ප්‍රජාව පිළිබඳව දැනට මා දැක ඇති ප්‍රබලතම ඡායාරූප එකතුව මෙය බවයි. සැබැවින් ම, වඩාත් නිවරැදිව පවසන්නේ නම්, මේ ප්‍රජාව පිළිබඳ මා දැනට දැක හෝ කියවා ඇති ප්‍රබලතම කතිකාවන් ගෙන් එකක් මේ බවට මා තුළ සැකයක් නැත.

පර්යේෂකයෙකු ලෙස සහ විශ්වවිද්‍යාල ගුරුවරයෙකු ලෙස, මේ ප්‍රජාවගේ ප්‍රභවය හා ඉතිහාසය මෙන්ම ඔවුන්ගේ ජීවන ශෛලිය හා දේශපාලනය පිළිබඳව නොයෙකුත් පර්යේෂකයින් සහ ශාස්ත්‍රඥයන් විසින් ලියා ඇති බොහෝ දේ මා කියවා ඇත. එනමුත්, ඒ සියල්ල හා සැසඳීමේදී මේ තරුණ තරුණයින් විසින් දෘශ්‍යමය වශයෙන් කියා ඇති මේ

කතිකාවත වඩාත් තීව්‍ර හා අව්‍යාජ බව මගේ වැටහීමයි. මෙහි ඇති එක් ඡායාරූපයකට දී තිබූ තේමාව මේ සමස්ත ප්‍රදර්ශනයම විස්තර කරනු ඇතැයි මා සිතමි. එනම්, 'මේ සරල බව නොවේ, දුප්පත්කම' බවයි. මේ තරුණ තරුණියන් සමස්තයක් ලෙස කියාපාන්නේ, තමන්ගේ ජීවිත හා බැඳී ඇති දරිද්‍රතාව හා ජය ගැනීමට අපහසු අනේකවිධ අභියෝග පිළිබඳ කතාවයි.

මේ වතුකරය පිළිබඳව සංචාරක පෝස්ටර්වල හා වර්ණ පෝස්ට් කාඩ් මගින් කියාපාන පරාදීසය පිළිබඳ කතාව නොවේ. මේ ඒ මිථ්‍යා කතිකාව පිටුපස ඇති අවාසනාවන්ත යථාවයි. ප්‍රදර්ශන අවස්ථාවේදී මා එහි සිටි එකම ඡායාරූප ශිල්පියෙක් සමගවත් කතා කළේ නැත. එනමුත් මම එහි තිබූ සියලුම ඡායාරූප දෙතුන් වතාවක්ම හොඳින් බැලුවෙමි. එසේ කතා නොකිරීමට හේතුව, ඔවුන්ගේ කතාව දෘශ්‍යමය වශයෙන් මේ ඡායාරූප පෙළ මගින් ඔවුන් බලසම්පන්න ලෙස සන්නිවේදනය කර තිබීම ය. එතැනින් එහාට කතා කළ යුතු වෙනත් යමක් ඉතිරි වී නොතිබුණි.

මේ ඡායාරූප මගින් අප වෙත ඉදිරිකරන තවත් කතිකාවක් තිබේ. එනම්, අප රටේ දේශපාලනයේ මුල්බැස ඇති කුහකකම සහ ඔලමොට්ටලකම පිළිබඳ කතාවයි. 2020 දී මේ තරුණ තරුණියන්ට තම ජීවිතයේ යථාව මෙතරම් දුක්බර ආකාරයකින් ඉදිරිපත් කරන්නට සිදු වී ඇත්තේ ඇයි? නිදහසෙන් පසු ජාතික දේශපාලනය විසින් මේ ප්‍රජාව බ්‍රිතාන්‍යය යටත් විජිත යුගයේ ඔවුන් සිටි අවාසනාවන්ත තත්වයෙන් නිසි පරිදි මුදවා ගෙන නැති බව පැහැදිලිය. එමෙන්ම, මේ ප්‍රජාව නියෝජනය කරනවා යැයි පුන පුනා කියන සමස්ත ලංකා වතු කම්කරු සංගමය සහ එවැනි අන් දේශපාලන කණ්ඩායම් විසින් ද පෙන්නුම් කර ඇත්තේ, ඔවුන් තවදුරටත් මේ ප්‍රජාව දරිද්‍රතාව තුළම සිර කර සිටින බවයි.

මේ ඡායාරූප දුටු විට, මගේ සිතට නැගුණේ ඉන්දීය ඡායාරූප ශිල්පී රඝු රායි විසින් ඡායාරූපගත කරන ලද ඉන්දියාවේ නොයෙකුත් ස්ථානවල ආන්තික ලෙස පිහිටුවා ඇති සරණාගත කඳවුරුවල පින්තූර වෙතය. රඝු රායිගේ එකතුවෙන් කොටසක් මීට වසර කිහිපයකට පෙර දකුණු ආසියානු විශ්වවිද්‍යාලයේ ප්‍රදර්ශනය කිරීමට එහි සමාජ විද්‍යා අධ්‍යයනාංශය කටයුතු කර තිබුණි. ඒ අපගේ පාඨමාලාවක කොටසක් වශයෙනි. කෙසේ වුවද, රඝු රායි ඡායාරූපගත කර තිබුණේ සරණාගතයින් හා සරණාගත කඳවුරුය. නමුත් මේ තරුණ තරුණියන් ඡායාරූප ගත කර තිබෙන්නේ ඔවුන් දිනපතා ජීවත්වන අවකාශ හා ප්‍රදේශයි. ඒවායින් පෙන්වන්නේ තමන්ගේ නිවෙස්ය. තමන්ගේ වටපිටාවය. තමන්ගේ

නෑදෑයින්ය. මේ සරණාගත කඳවුරු නොවේ. එමෙන්ම, මොවුන් සරණාගතයින් ද නොවේ. මොවුන් ශ්‍රී ලාංකේය පුරවැසියන්ය.

මා සිත්නේ සිය ඡායාරූපවලින් මේ තරුණ තරුණියන් අසන ප්‍රධාන ප්‍රශ්නය නම්, තමන්ගේ යථාවට වගකිව යුත්තේ කවුරුන්ද යන්න බවයි. කණගාටුදායක කාරණය වන්නේ, මේ අවාසනාවන්ත තත්ත්වයට වගකිව යුතු කතුවරුන්ගෙන් කොටසක් ජීවත් වන්නේ ඔවුන් අතරම වීමය. අන් කොටස ජීවත්වන්නේ අප අතරය.

මහාචාර්ය සසංක පෙරේරා
දකුණු ආසියානු විශ්වවිද්‍යාලය
Patitha.lk/ 26.09.2020

# තේ කහට

## වේදනාව දෙස කලාත්මකව බැලීම

"ෆොටෝ බලන්න ආපු හැමෝම අහපු එක කාරණයක් තිබ්බා. ඒ තමයි ඇයි ඔයාලා දුක විතරක් පෙන්නුවේ. ඇයි සතුට පෙන්වන්න උත්සාහ නොගත්තෙ කියලා. බලන්න මේවයේ තියෙන්නෙ දුක, පසුබෑම විතරයි. මොකක්දෝ පශ්චාත්තාපී හැඟීමකුයි උත්පාද වෙන්නෙ. ඔය වගේ කතා බරට කියපු අයත් හිටියා. අපි උත්තර දුන්නා. සතුට පෙන්වන්න තවත් අය ඉන්නවා. එයාලා සතුට නිරූපණය කරනවා. අපිට වුවමනා වුණේ දුක පෙන්වලා ඇත්ත කියන්න. සතුට තවම ඈතයි කියන්න. වෙන අය පෙන්වන සතුට ඇතුළෙත් දුක තියෙනවා කියන්න. කවුරුහරි තේ යායක ලස්සන පෙන්වන පින්තූරයක මුල් පේන්නෙ නැහැ. ඒ මුල් ගාව පරිස්සමට බැලුවොත් දුක දකින්න පුළුවන්"

බණ්ඩාරවෙල ඌව හයිලන්ඩ් හී පදිංචි තරුණ ගුරුවරියකද වන එස්. ශ්‍රී දේවි තලවකැලේ කදිරේශන් කෝවිලේ දිගු පුළුල් ශාලාවෙන් පිටත එළිමහනේ සිට කියන්නී වතුකරයේ තරුණ තරුණියන්ගේ සේයා රූ දැක්මක කොටස්කාරියක් ලෙස ඈ ලද අත්දැකීම් ගැනය. ශ්‍රී දේවි විසින් ගනු ලැබූ ඡායාරූපයක්ද එහි සියයක් ඡායාරූප අතර ප්‍රදර්ශනය කෙරේ. බදුල්ල හා නුවරඑළිය දිස්ත්‍රික් දෙකෙහි තරුණ වතුකර ජනයා නියෝජනය කරන මේ ඡායාරූප ශිල්පීන් සියලු දෙනා ආධුනිකයෝ ය. ඔවුන් කිසිවෙකුට තමන්ගේම යැයි කිව හැකි කැමරාවක් හෝ නැත. බදුල්ල දිස්ත්‍රික්කයේ ඇටම්පිටිය සහ ඌව හයිලන්ඩ් වතුවලද, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ලොගී සහ හොලිරූඩ් වතුවලද ඡායාරූපකරණයට ළැදි තරුණ ප්‍රජාව මේ ප්‍රදර්ශනය නියෝජනය කළ අතර අජිත් සෙනවිරත්න සහ නදිෂ්ක රණසිංහ කැමරාකරණය

හා ඡායාරූප සංස්කරණය පිළිබඳ පුහුණු සැසි පවත්වමින් ඔවුන්ට දිරි දුන්හ. අවසන වතුකරයේ පණ ගැහෙන හැටි කියැවෙන සේයා රූ හතළිස් පන්දහසකින් සියයක් තෝරා ගෙන කාලය අවකාශය හරහා නොදුවන ලෙස ඇණ ගසා එක තැන නවතා තැබූ දුක පිළිබඳ ලෝකයට කියන්නට තීරණය කළ බව සමස්තයේ සම්බන්ධීකාරකයෙකු වන කිවියර ළහිරු කිතලගම කීවේය.

"කඳුකර දෙමළ ප්‍රජාව ලංකා ආර්ථිකයේ සුවිශේෂී පංගුවක්. සිලෝන් ටී ජනප්‍රිය වුණාට මේ මිනිස්සු ගැන කවුරුවත් කතා කරන්නේ නැහැ. අවුරුදු 200ක් තිස්සේ මේ ජනතාව අවවරප්‍රසාදිතයි. ඒ හින්දා අපිට වුවමනා ඔවුන් ගැන කතිකාවක් පටන් ගන්න. ඒක පොලිසි ලෙවල් එකේ වැඩක් වෙන්න ඕන කියල අපි හිතුවා." කිතලගම කවියා අලුත් කවියක මුල පාදා පෙන්වයි.

**අරගල කළ හැකිය.**

"අපි ගැටුම වෙනුවට ආර්ට් තෝරා ගත්තා අරගල කරන්න. පොටෝග්‍රැෆි තෝරගත්තෙ මේ තරුණ කණ්ඩායම ඒකට සෙට් වෙන නිසා. අපි ඔවුන්ට එක විදියක වෘත්තීය පුහුණුවකුත් දුන්නා. දැන් වතුකරයේ මේ කොල්ලන්ට කෙල්ලන්ට නමක් තියෙනවා පොටෝ ගහන්න දන්නවා කියලා. හැබැයි ඒක නෙවෙයි ලොකුම කටයුත්ත. කලාව යොදාගෙන සමාජ විපරිවර්ථනයක් කරන්න පුළුවන් ය කියන කාරණාව ගැන ඔවුන් සවිඥානික කරන්න අපට පුළුවන් වුණා." ළහිරු කිතලගම කවියා පරිවර්තනයේ තරම කියද්දී අවශේෂ කාරණා කිහිපයක් පිළිබඳ හැඟවුම්කාරකද ශේෂ ව තිබුණි. කදිරේශන් කෝවිලේ ශාලාව පිළියම් කොට ඡායාරූප එල්ලීම සඳහා වෙහෙස වෙද්දී මේ කුමක්ද? මෙවැන්නක් කුමකටදැයි ප්‍රශ්න කළ සෙවණැලි රූපකයෝද වූහ. උත්ප්‍රාසය උපදින්නේ එතැනිනි. අවශ්‍ය නම් මේ ප්‍රදර්ශනයට එබී බලා දුක වටහා ගත හැකිව තිබුණි. එය සෙසෑන්ගේ සිත්තමක් වාගේය. "එල්ලී මළ මිනිසාගේ නිවස වාගේ ය" හාත්පස ඇත්තේ දුකය, අඳුරය, තනිකමය. ඔවුනගේ රුපියල් දහසේ වැටුප් අරගලය සීතලව ගල් ව ගොසිනි. නිවෙස් හිමිකම් ලබා දීමේ දේශපාලන කතාව පැරණිය. ගෞරවය පිළිබඳ අරගලය එතැනම ය. කහට තිත්තේ ප්‍රියමනාප බව ජීවන තිත්තේ නැත.

ඉදින් මේ වේදනාත්මක ජීවන සෞන්දර්යය ගැන ඔවුන්ගේ ඇසින් බැලිය යුතුය. "මේ පින්තූර සිනමා කාව්‍යයක් වගේ පෙළ ගස්වන්න ඕන. එතකොට කවදහරි ඒක අරගලයේ

සෞන්දර්යය ගැන මතකයක් වෙයි.” කඳුකර ලේඛකයෙකු වන එම්. සිවලිංගම් පවසන්නේ එහෙයිනි. “මේ මහපොළවෙ තියෙන ගස් කොළං දැන් අපිට අඬ ගහන්නේ වළට වරෙං කියලා. යන්න කලිං අපි මේ තරුණයන්ට කියන්නේ වේළිලා මැලවුණු සමාජය ගොඩගන්න කියලා. කඳුකරයේ දේශපාලකයෝ මේ ඡායාරූප පාර්ලිමේන්තුවේ පෙන්වන්න අවස්ථාවක් උදා කරගත යුතුයි. සුළුතර කණ්ඩායමක වේදනාව බලයේ ඇහැ ගැටෙන්න සළස්වන්න. යැයි සිවලිංගම් පවසයි.

## නිද්‍රාවෙන් මුදාලීම

“ඇත්තටම මේක ප්‍රශ්න ගැන පෙන්වන පින්තූර ප්‍රදර්ශනයක් නෙවෙයි. අපේ අරමුණ අපි තුළම, අපි ගැන සමාජ සවිඥානිකත්වය ඇති කර ගැනීම.”  පින්තූර හිමිකරුවන් බවට පත්ව සිටින හැම කොල්ලෙකු, කෙල්ලකම එසේ පවසන්නේ කට පාඩමින් නොවේ. වතුකරයේ හැම බිම් අඟලකම ඇවිද කැමරාව මානද්දී ඔවුන් තුළ උත්පාද වූ හැඟීමයි ඒ.

“සමාජය ගැන ගැඹුරින් නොහිතපු අපි මේ වැඩෙන් ගැඹුරු දැක්මක් ඇති කර ගත්තා.” යැයි ශ්‍රී දේවි පවසන්නේ එහෙයිනි. “මේ පින්තූරවල තියෙන්නේ අපේ ජීවිත. හැබැයි මෙච්චර කාලයක් අපි ඒ ජීවිත ගැන, ඒ ජීවිත පෙළන ප්‍රශ්න ගැන කතා නොකර කොටුවක හිර වෙලා හිටියා. ඉතිං ඒ ජීවිත පින්තූර හැටියට රාමු කළාම අපි දැක්කා මහා සමාජයට සාපේක්ෂව අපි ඉන්නෙ දුකක, පසුබෑමක කියලා. අපි මේකෙදි වතුකරයෙ අපේ හාම්පුතුන්ට, දේශපාලකයන්ට ඉඟි කරනවා මේක තමයි අපේ අරගලයේ සෞන්දර්යය කියලා” ඇය පවසන්නීය.

හැටන් හි එන්. ප්‍රියදර්ශනී උසස්පෙළ නිමවා නිවසේ සිටියදී මේ හා සම්බන්ධ වූ හා ඉන් ජීවිතය උගත්තියකි. “අපි දකින දේවල් පොටෝවලින් දැක්කම මේ අපේ ජීවිතද කියලා අපිට අපි ගැනම දුක හිතුණා” යැයි ඇය පවසන්නීය. “පින්තූර බලන්න ආපු අය අපේ ස්කිල්ස් දැකලා සතුටු වුණා. මේවයේ කන්ටෙන්ට් දැකලා දුක් වුණා.” දුක හා සතුට එකම කේන්ද්‍රයක නාභිගත වූ අන්දමද ඇය පෙන්වා දෙන්නීය.

සිය ජීවිතයේ අනේක කම්කටොලු සෞන්දර්යාත්මකව විදාරණය කරන්නට ඉඩ ලැබීම පිළිබඳව සතුටු වන බව තරුණ යුවරාජ්ද පවසයි. “ගොඩක් අය මේවා දැකල දුක් වුණා. ඒ අයගේ දුක දැකලයි මම සතුටු වුණේ. මොකද මේක අපි සමාජය එක්ක කරන අරගලයක්

නිසා. අනෙක් හැමෝම අපිට වඩා හොඳින් ජීවත් වෙනවා. අපිට නැති දේවල් එයාලට තියෙනවා. අපි මේ කියන්නේ අවුරුදු දෙසීයක දුක ගැන."

යුවරාජ්ගේ මේ කතාබහට සවිය දෙන්නේ ඔවුන් අතර සම්බන්ධීකරණය ගොඩනැඟූ එම්. ප්‍රදීපන් ය. "ඇත්තටම මේ හැමෝම මුලින්ම අපි එක්ක කිව්වේ එයාලගේ වෙහෙස ගැන. මේ හැමෝම ජීවත් වීම නිසා වෙහෙසිලා හිටපු අය. කැමරාවක් දැකලාවත් නැති අයට පොටෝ ගහන්න කියලා දුන්න එක නෙවෙයි කතාව. මතුවෙච්ච දේ. වතු හාම්පුත්තු කදිරේශන් කෝවිලට ආවේ මොකක් හරි එක්සිබිෂන් එකක් බලන්න එනවා කියන සරල අදහස ඇතිව. හැබැයි මේක දැකල ඔවුන් කම්පනයට පත් වුණා. දැන් හරියට හැමෝම ඉස්සරහ ගැඹුරු වළක් කපලා වගේ. වළට එබිලා බලපුවම ජනතාව ඒකට වැටිලා ඉන්නවා. අන්න ඒක තමයි ඉම්පැක්ට් එක. අනෙක් පැත්තට අපි පිළිගැනීමක් නැති මිනිස්සුන්ගේ දරුවන්ට පිළිගැනීමක් දුන්නා" ඔහු ඉදිරිය පිළිබඳ දැක්මක් ඇතිව පවසයි.

"මේ පින්තූර බලන්න ආපු ජීවන් තොන්ඩමානුත් කම්පනය වුණා. එයා කිව්වා මේක ජාත්‍යන්තර මට්ටමේ පින්තූරත් තියෙන වැඩක් කියලා. උදව් කරන්නම් කියලත් කිව්වා. හැබැයි දේශපාලනඥයන්ගේ උදව්ව වෙන්න ඕන කැමරා නැති දරුවන්ට කැමරා අරන් දෙන එක විතරක් නෙවෙයි. ඒ හරහා ජීවන අරගලය දිනවන එක" ඒ පින්තූර හිමිකාර ඇස්වල හැඟීමයි. දැන් කැමරාවක් නැතත් ඔවුන් තුළ අදහසක් ඇත. මතවාදයක් හා දිනිය යුතු අරගලයක් ඇත. ඒ හැඟීම කියාපාන්නේ එයයි. එය ඔබටද නැරඹීමට පුළුවන. ඒ හැඟුම් හා සමපාත වීමටද පුලුවන.

මාධ්‍යවේදී ලසන්ත ද සිල්වා
අනිද්දා පුවත් පත / 30.08.2020

# ඔබේ

## තේ කෝප්පයේ කඳුළු

දශක ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ පිහිටි දූපතක් ලෙස ලෝකය පුරා කීර්තියක් හිමි කරගෙන සිටියේ සුන්දරත්වය, සන්සුන් බව සහ තේ සම්බන්ධයෙනි. දූපත් රාජ්‍යයේ ආර්ථිකයේ පිටකොන්ද ශක්තිමත් කළ තේ කර්මාන්තයේ පදනම සකස් ව තිබුණේ ශතවර්ෂ ගණනකට පෙර බ්‍රිතාන්‍යයන් විසින් වහලුන්ට සමාන ලෙස මෙරටට රැගෙන එනු ලැබූවන්ගෙන් පැවත එන ඉන්දීය සම්භවයක් සහිත දෙමළ කම්කරු බලකායක් මත ය. ජීවන මට්ටම, සංවර්ධනය සහ මානව හිමිකම් සම්බන්ධයෙන් මෙම ප්‍රජාව දිගු කලක් තිස්සේ පසුගාමීව සිටින්නේ මේ මොහොත වන විටත් දේශපාලන, ආර්ථික සහ සමාජමය වශයෙන් ආනතිකකරණයට ලක් වෙමිනි.

“තේ කහට” වෙනස් ආකාරයේ ඡායාරූප ප්‍රදර්ශනයකි. මෙම ප්‍රදර්ශනයේ විශේෂත්වය වූයේ, වතුකරයේ ඉතාමත් වෘත්තීය මට්ටමේ ඡායාරූප අප වෙත ගෙනවිත් තිබුණේ නගරයේ පිළිගත් ශිල්පීන් විසින් නොව වතුකර ක්ෂේත්‍රයේ තරුණයන් විසින් ම වීම යි. ශ්‍රී ලංකාවේ වතුකරයේ ව්‍යාජ සුන්දරත්වයක් තුළ අලුත් අභියෝග සහ ජීවිතයේ ගැඹුරු දුක්ඛිත තත්ත්වයන්ට එම ප්‍රජාව මුහුණ දෙන ආකාරය ගැන ඔවුන්ගේ ම අත්දැකීම් අපට නැවුම් ලෙස යන්තමින් විදහා දැක්වීමක් ප්‍රදර්ශනය මගින් සිදුවෙයි. තේ දළු නෙළමින් ද, සාත්තු කරමින් වතු රැක බලා ගනිමින් ද, එහි නිෂ්පාදන ක්‍රියාවලිය පවත්වාගෙන යන උඩරට දෙමළ ප්‍රජාව, සමස්ත රටේ ම ආර්ථිකය බල ගන්වන එම කර්මාන්තයෙන් අඩු ම ප්‍රතිලාභ ලබන පිරිස වන ආකාරය මෙ මගින් අපට පෙන්නුම් කරයි.

සංවර්ධන දර්ශක ගණනාවකට අනුව මෙම ප්‍රජාව ශ්‍රී ලංකාවේ අනෙක් කොටස් සමග සංසන්දනය කළ විට සිටින්නේ බොහෝ සෙයින් පිටුපසිනි. අනෙකුත් ශ්‍රී ලාංකිකයන්ට හිමි ඇතැම් මූලික අයිතිවාසිකම් අහිමි කරනු ලදුව, රටේ අඩු ම වැටුප් ලබමින් සිටින මෙම ප්‍රජාවේ සාමාජිකයින්ට, ඔවුන් පරම්පරා ගණනක් තිස්සේ ජීවත් වූ දුක්ඛිත ලෙස තදබද වූ ලයින් කාමර අයිතිකර ගැනීමට පවා බොහෝවිට හැකියාව නැත. එමෙන් ම, ආන්තිකකරණයට ලක් වූ බොහෝ ප්‍රජාවන් තුළ මෙන් ම, වතුකරයේ දී ද , ආදායම සහ අයිතිවාසිකම් යන අංශ දෙකෙන් ම වඩාත් පීඩාවට පත් වන්නෝ ස්ත්‍රීහු ය.

අවම දෛනික වැටුප රුපියල් 1000ක් (බ්‍රිතාන්‍ය පවුම් 4 ක් පමණ) සඳහා අරගලය දිගට ම පවතින අතර එක් දිනක දී තේ දළු  කිලෝග්‍රෑම් 16 -18 ක් කඩා රැගෙන ඒමට තවමත් ඩොලර් කිහිපයක මුදලක් ගෙවණු ලබන්නේ, ස්ත්‍රීන්ට හැම විට ම පුරුෂයින්ට වඩා අඩු වැටුප් ගෙවීමේ තත්ත්වයට ද මුහුණ දෙමිනි. වතු කම්කරු ජනතාව මුහුණ දෙන වෙනස්කම් කිරීම්වලට, ඉඩම් හෝ දේපළ අත්පත් කර ගැනීමේ අවස්ථාවල අසමානතාව, තමන්ගේ නිවෙස් සඳහා තැපැල් ලිපිනයක් නොමැති වීම වැනි තත්ත්වයන්ගෙන් පෙනෙන පරිදි, සනීපාරක්ෂාව, මාර්ග පහසුකම්, මූලික සෞඛ්‍ය වැනි රජයෙන් සපයන සේවා බොහොමයක් වතු කළමනාකරණය විසින් ඉටුකරන තත්ත්වයක් තුළ, තේරුමක් ඇති පුරවැසිභාවයක් යන්න දිගින් දිගට ම මිරිඟුවක් බවට පත් වෙයි. වතුකරයේ බල ගතිකය කෙබඳු ද යත් වත්තක සිට නාට්‍යයකට සහභාගීවීමට පවා වතු කළමනාකරණයේ අවසරය සහ එකඟතාවය අවශ්‍ය වන ලෙසින් ඔවුන්ගේ මානව සම්පත ස්වාමියාට අයිති ලෙස පවත්වා ගෙන යන්නේ නූතන වහල් සේවයක් ආකාරයෙනි.

'තේ කහට' ප්‍රදර්ශනයේ ඡායාරූප ගෙන ඇත්තේ උඩරට කලාපයේ තෝරාගත් වතු හතරක තරුණ තරුණියන් 40 දෙනකු විසිනි. එනම් නුවරඑළිය දිස්ත්‍රික්කය නියෝජනය කරමින් හොලිවුඩ්, ලොගි වතු සහ බදුල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ඇටම්පිටිය සහ ඌව හයිලන්ඩ් වතු ය. ඔවුන්ගේ අදහස් එලදායී ලෙස සන්නිවේදනය සඳහා පදනමක් ලබාදීමට ඡායාරූපකරණය සහ නිර්මාණාත්මක ඡායාහඬ සංකල්ප ගැන තාක්ෂණික දැනුම සමග පුහුණු වැඩමුළුවක් බදුල්ලේ ඌව ශක්ති පදනමේ වැඩ සටහනක් ලෙස ක්‍රියාත්මක කෙරිණ.

සමාජ පරිවර්තනයක දැක්මක් සඳහා සමාජ සහ දේශපාලන පසුබිම පිළිබඳ වඩා හොඳ අවබෝධයකට සමාජ සංවේදීතාවය ගොඩ නැගීමේ ක්‍රියාවලියකින් සහභාගී වූ තරුණයෝ වැඩ කටයුතු ආරම්භ කළහ. ශ්‍රී ලංකාවේ පාස්කු ඉරිදා ප්‍රහාරය නිසා සහ ඉතා මෑතක දී කොවිඩ් 19 වසංගතය තුළින් ඇති වූ බරපතළ අභියෝග මැද වසරක් පුරා මෙම ක්‍රියාවලිය ක්‍රියාවට නගනු ලැබී ය. උද්යෝගිමත් තරුණයෝ (ඔවුන්ගේ මවුපියන්ගේ ද විශාල සහායක්

ඇතිව) අධිෂ්ඨාන කොට ගත්තේ තමන් විසින් ම තමන්ගේ ම කාච තුළින් තම ප්‍රජාවගේ දර්ශන ලබාගෙන ප්‍රදර්ශනය කිරීමට ය.

මෙම ව්‍යායාමයේ අවසන් අරමුණ වූයේ, සමාජය තුළ තම තත්ත්වයේ වඩා හොඳ සමාජීය සහ ආර්ථික සංවර්ධනයක් සඳහා උඩරට දෙමළ ජනයා අතර කතිකාවක් ගොඩනැගීම ආරම්භ කිරීමයි. උප අරමුණක් වූයේ ඔවුන් එබඳු වෘත්තියක් තෝරා ගැනීමට කැමති වන්නේ නම්, ඒ සඳහා අනාගතයේ වත්ත තුළ සහ ඉන් පිටත ඔවුන්ට වඩා හොඳ අවස්ථා ලැබෙන පරිදි, වෘත්තීය ඡායාරූපකරණ සුදුසුකම් ලබාදෙමින් තරුණ ප්‍රජාව බලසතු කිරීම යි.

වතුකර ක්ෂේත්‍රයේ ඡායාරූප ජනමාධ්‍යවේදය පිළිබිඹු කළ 'තේ කහට' ප්‍රදර්ශනය සැප්තැම්බර් 26 - 27 දිනවල ලයනල් වෙන්ට් කලාගාරයේ දී පැවැත්විණි. ප්‍රදර්ශනයත්, වතුකර ක්ෂේත්‍රයේ තරුණයින් බලසතුකරණය සඳහා සහ ඡායාහඬ සන්නිවේදනය තුළින් වතුකර ප්‍රජාවගේ ප්‍රශ්න සම්බන්ධ කතිකාවට වැඩි ඉඩකඩක් ගොඩ නැගීමේ සමස්ත ව්‍යාපෘතියත් සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පහසුකම් සපයන ලද්දේ යුරෝපා සංගමයේ සහ ජර්මන් ෆෙඩරල් විදේශ කාර්යාලයේ හවුල් මූල්‍ය ආධාර මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතියක් වන ශ්‍රී ලංකාවේ සංහිඳියා ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ හවුල්කාරිත්වය (*SRP*) සමග ය.

උඩරට දෙමළ ප්‍රජාවගේ ක්‍රියාකාරී දායකත්වය සහිතව බදුල්ලේ ඌව ශක්ති පදනමේ සහයෝගයත්, සහ තම වතුවල වැඩමුළු පැවැත්වීමට අවසර දීමේ සිට ප්‍රදර්ශනය දක්වා දිගට ම ආධාර කරමින් හොලිවුඩ්, ලොගි, ඇටම්පිටිය සහ ඌව හයිලන්ඩ් වතුවල සහභාගීත්වයත්, වැඩසටහනේ සාර්ථකත්වයට හේතු විය. ඡායාරූප ශිල්පය පිළිබඳ වෘත්තීය පුහුණුව ලබාදෙන ලද්දේ ප්‍රවීණ ඡායාරූප ශිල්පීන් වන අජිත් සෙනෙවිරත්න සහ නදිෂ්ක රණසිංහ විසිනි.

චන්ද්‍රිකා ගාදියවසම් සහ නදීෂා පවුලිස්
නිදහස් මාධ්‍යවේදී සහ ලේඛිකා
Daily FT පුවත් පත / 03.10.2020

# වතුකරයේ

## හෘද සාක්ෂිය

## තේ කහට ඡායාරූප ප්‍රදර්ශනය

පසුගිය වසර 200 ක් තිස්සේ වතුකරය ආශ්‍රිත ජන ජීවිතවල සහ යටිතල පහසුකම් මෙන්ම ඔවුන්ගේ වාසස්ථානයන්හි කිසිම වෙනසක් සිදු නොවූ බව මුළු ලෝකයටම ප්‍රදර්ශනය වන පරිදි තේ කහට ඡායාරූප ප්‍රදර්ශනය සංවිධානය කර තිබුණි. කොළඹ 07, ලයනල් වෙන්ට් රඟහලේ දී පවත්වන ලද තේ කහට ඡායාරූප ප්‍රදර්ශනය මගින් පෙන්නුම් කරන ලද්දේ, වතුකරයේ ජනතාව වෙනුවෙන් ඉදිකරන ලද, නිවාස යෝජනා ක්‍රම හරහා ඔවුන්ගේ ජීවන තත්ත්වයන් සම්පූර්ණයෙන් පරිවර්ථනයකට ලක් කරනු ලැබ ඇති බවට වන නිගමනයකට දේශපාලනඥයන් පැමිණ තිබීම නිවැරදි නොවන බවයි.

තේ කහට යනු ලංකාවේ බදුල්ල හා නුවරඑළිය දිස්ත්‍රික්කවල ජීවත් වන තරුණ තරුණියන්ගේ ඡායාරූප එකතුවකින් යුත් ජාතික මට්ටමේ ඡායාරූප ප්‍රදර්ශනයකි. මෙම ප්‍රදර්ශනය එකී ඡායාරූප ශිල්පීන් නියෝජනය කරන සමාජය පිළිබඳ කතාන්දරය අපට පැහැදිලි කිරීම සඳහා කැමරා ඇසින් ඔවුන්ගේ ලෝකය රස විඳීමටත් අනාගතය පිළිබඳව ඔවුන්ගේ බලාපොරොත්තු අප සමඟ බෙදා හදා ගැනීමටත් දියත් කරන ලද එක්තරා උත්සාහයක ප්‍රතිඵලයක් වන අතර මෙම ඡායාරූප ප්‍රදර්ශනය මගින් වතුකරයේ අඳුරු පැතිකඩවල් පමණක් ප්‍රදර්ශනය කරනු ලැබ ඇති බවත්, සංවර්ධන ව්‍යාපෘතීන් සැලසුම්සහගතව සඟවනු ලැබ ඇති බවත් සමාජ ජාලාවල විවිධ ආකාරයේ විවේචනයන්ද ඊට එරෙහිව එල්ල කරන ලදී. තමන්ට එරෙහිව එල්ල වන විවේචන තමන් අගය කරන නමුත් එය ධනාත්මක විවේචනයන් විය යුතු බව සංවිධායකයන්ගේ මතය වී තිබේ.

මෙහිදී තම නිර්මාණයන් ඡායාරූප ප්‍රදර්ශනයට එක්කළ තරුණ ඡායාරූප ශිල්පීන් දෙදෙනෙකුට ලංකාවේ ජනප්‍රිය ඡායාරූප ශිල්පියෙකු වන ඩොමිනික් ඇන්තනීගේ කාර්යාලයේ සේවයේ කිරීමේ වරම් හිමි විය. තවත් බොහෝ දෙනෙකුට දිවයිනේ විවිධ මාධ්‍ය ආයතනවල සේවය කිරීම සඳහා ඇරයුම් ලැබී තිබේ.

මෙහි ප්‍රදර්ශනය කර තිබූ ඡායාරූපවලින් පෙන්නුම් කරන ලද්දේ අදටත් වතු කම්කරුවන් අත්විඳින දුක්ගැහැට පිළිබඳවයි. ඉතා සීමිත ඉඩ පහසුකම් සහිත ලයන් කාමරවල ගත කරන ඔවුන්ගේ ජීවිත සහ තේ දළුවල බර කිරා බැලීමේ තරාදි තමන්ගේ හිස මත තබා ගෙන ඇවිද යන වතු කම්කරුවන්ගේ ඡායාරූප හා පහසුකම්වලින් තොර ජීවිතයක් ගත කළත් වතුකරයේ ජීවත් වන පුංචි සිඟිත්තන්ගේ මුව පිරුණු සිනහව සහිත ඡායාරූප අපගේ සිත් නැවත වාරයක් අතීතය කරා ගෙන යාමට සමත් වී තිබේ. වැසිකිළියයි මුළුතැන්ගෙයයි එකින් එකට යාබදව පිහිටා ඇති ස්ථානයක ආහාර පිසීම් කටයුතු සිදු කිරීම, දෙමව්පියන් තේ කූඩය පිටේ බැඳගෙන යන විට ළමයින් පාසල් වෙත පියමන් කරන ඡායාරූප හා හිස් මත්පැන් බෝතල්වල පුරවා ගෙන විත් කාන්තාව විසින් තේ පානය කරනු ලබන ඡායාරූප සහ තේ කඳුගැට මත වාඩි වී අපහසුතා මැද ආහාර ගනු ලබන දසුන් ප්‍රදර්ශනය කෙරෙන ඡායාරූප අපගේ ජීවිතවල එදිනෙදා දැකිය හැකි සාමාන්‍ය සිදුවීම් වශයෙන් පෙන්වා දිය හැකිය.

කෝටි ගණන් සාමාජික මුදල් ලබා ගෙන සුඛෝපභෝගී ජීවිත ගත කරන වෘත්තීය සමිතියේ අයට එවන් සුඛෝපභෝගී ජීවිතයක් ගත කිරීමට මග පාදා ඇත්තේ වතු කම්කරුවන් බව මෙම ඡායාරූපවලින් මනාව නිරූපනය කරනු ලබයි.

මෙහි ප්‍රදර්ශනය කර තිබූ ඡායාරූපවලින් පිළිබිඹු වන්නේ වතුකරයේ ජනතාව මුහුණ දෙන යම්යම් ප්‍රශ්න පිළිබඳවයි. තවදුරටත් පැහැදිලි කළ නොහැකි බොහෝ කරුණු දක්නට තිබෙන අතර ඒ ගැනද ඉදිරියේ දී කැමරා කාච තුලින් මතු කර පෙන්වා දිය යුතුව ඇත.

අභාවයට පත් වෙමින් තිබෙන අප නියෝජනය කරන සමාජයේ අනන්‍යතාවයන් සොයා ගොස් එය අගනා භාණ්ඩ ලෙස සහ අමතක කරන ලද නැටුම් කලා ඡායාරූප ලෙස ප්‍රදර්ශනය කර තිබුණි.

ජාතික කලාගාරයක වතුකරයේ ජනතාවගේ ගැටළු ප්‍රදර්ශනයට තබා තිබීම වැදගත් කාරණයකි. ජන ජීවිතය යනු කුමක්ද යන්න පිළිබඳව භාෂාවලින් ඔබ්බට ගිය මෙවන් ඡායාරූප පෙළ තුලින් සියළු දෙනා විසින් පහසුවෙන් තේරුම් ගත හැකිය. ඡායාරූපවල අපට දැක ගත හැකි ජනතාවගේ මුහුණුවල තිබෙන ඉරියව් අපට බොහෝ දේ පවසයි.

වතුකරයේ ජනතාවගේ ගැටළු මතු කර පෙන්වා දෙනු ලබන්නේ දේශපාලකයින් විසින් බවට වූ මතයක් පවතී. සැබෑ ලෙසම ඉන් ඔබ්බට ගොස් කලාකරුවන්, ලේඛකයින් හා සිවිල් සමාජ ක්‍රියාධරයින් විසින් පවා තමන් දන්නා භාෂාවෙන් එය මතු කර පෙන්වනු ලබයි. ඡායාරූප ද එක්තරා ආකාරයේ භාෂාවක් වන අතර එය ඉස්මතු කර පෙන්වීමට සිවිල් සමාජය උත්සාහ කළ යුතුයි. මෙය නොසලකා හරිනු ලැබ ඇති ජනතාවගේ ප්‍රදර්ශනයක් ලෙස තමා දකින බව මෙම අවස්ථාවට සහභාගි වූ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී මයිල්වාහනම් තිලකරාජ් මහතා පවසා තිබුණි.

මාස 18 ක පුහුණුවකින් පසු තරුණ ඡායාරූප ශිල්පීන් විසින් ඔවුන්ගේ ප්‍රථම 'තේ කහට' ඡායාරූප ප්‍රදර්ශනය නුවරඑළියේ දී 2020 අගෝස්තු මස 23 වැනි දින ප්‍රදර්ශනය කරන ලද අතර අගෝස්තු 29 හා සැප්තැම්බර් 14 සහ 15 යන දිනවල බදුල්ල නගරයේ දී පවත්වන ලදී. සැබෑ ජීවිතයේ දී ඔවුන් හා සෘජුව සම්බන්ධ වන කරුණු කාරණා ඔවුන්ගේ කැමරා ඇසට යොමු කර අප වෙත ලබා දී තිබේ. මෙකී සෑම ඡායාරූපයකින්ම අපට යම්කිසි පණිවිඩයක් කියා පානු ලබන අතර, අපගේ සමාජය තවත් කොපමණ දුරකට පසුබෑමකට ලක් වී ඇතැයි ද යන්න සාධක ඇතුව පෙන්වා දීමට සමත් වී තිබේ. වතුකරයේ ජනතාවගේ වර්තමාන තත්ත්වය මෙය වන අතර එය වෙනස් කිරීමේ අවශ්‍යතාවයක් අප ඉදිරියේ පවතී. එය ඉටු කිරීමේ භාරදූර වගකීමක් මෙකී සමාජයේ කර මත පටවනු ලැබ ඇත.

මෙම ඡායාරූප ප්‍රදර්ශනය අප විසින් වසරක කාලයක් තිස්සේ කරන ලද උත්සාහයේ ප්‍රතිඵලයකි. වතුකරයේ ජනතාවගේ ජීවනෝපාය පැහැදිළි කරන ආකාරයට, අප විසින් මෙම ඡායාරූප ලබා ගෙන තිබේ. කණ්ඩායම් දෙකකට බෙදී ඡායාරූප ශිල්පීන් 40 දෙනෙක් හරහා ලබා ගන්නා ලද ඡායාරූප හතලිස් දහසක් අතුරින් ඉතා උසස් තත්ත්වයේ ඡායාරූප 100 ක් මෙහි දී තමන් විසින් ප්‍රදර්ශනය කර ඇති බව තරුණ ඡායාරූප ශිල්පියෙක් අදහස් ප්‍රකාශ කරමින් කියා සිටියේය.

පසුගිය වසර දෙකක් තිස්සේ තමන් නියෝජනය කරන සමාජය මුහුණ දෙන දුක්ගැහැට පිළිබඳව කියා පෑමට ඡායාරූප ශිල්පීන් දැඩි වෙහෙසක් දරා තිබේ. මෙය හුදෙක් ඡායාරූප පමණක් නොව එයින් ඔබ්බට ගොස් ජන ජීවිතය අප තුළ රෝපණය කරන බීජයක් වන අතර එකී බීජ අනාගතයේ දී මහා විශාල රුක්ෂයක් සේ වැඩෙනු දැකීම බොහෝ දෙනෙකුගේ අපේක්ෂාවයි. අපගේ සමාජය අත්විඳින දුග්ගැහැට අප විසින්ම පෙන්වා දීමේ අවශ්‍යතාවයක් මේ වන විට ඉස්මතු වී තිබේ. අප තවමත් දියුණු නොවීමට හේතු වී ඇත්තේ එදා මෙදා තුරා සියළු දේ දේශපාලකයින් මතම රඳා පැවතීමයි.

පසුගිය වසර 200 ක් තිස්සේ වතුකරයේ ජනතාව විවිධ ගැටළුවලට මුහුණු දී සිටිති. මෙම ප්‍රදර්ශනයේ අරමුණ වී තිබුණේ එම ජනතාව මුහුණ දෙන ගැටළු ඡායාරූප හරහා අවබෝධ කර දිය හැක්කේ කෙසේද යන්න පිළිබඳවයි. විශේෂයෙන් කොළඹ ජීවත් වන තරුණ තරුණයින්, ලේඛකයින් හා කලාකරුවන් විසින් වතුකරයේ ජනතාවගේ ගැටළු විවිධ කෝණවලින් පෙන්වා දෙනු ලැබ තිබේ. අපගේ ප්‍රධාන අරමුණ වන්නේ අප මුහුණ පාන ගැටළු හා සැබෑ තත්ත්වයන් මෙරට ජීවත් වන අනෙක් ජන කොට්ඨාශයත් දැන ගැනීමට ඉඩ සැලැස්වීමයි.

ක්‍රියාත්මක කරනු ලැබ ඇති නිවාස යෝජනා ක්‍රම ප්‍රදර්ශනය කිරීම තුලින් අප විසින් ඉටු කරනු ලබන්නේ දේශපාලන ඕනෑ එපාකම් ඉටු කිරීමක් වන අතර අප එසේ කර තිබුණේ නම් දේශපාලන කාරණාවක් අප විසින් සිදුකරන බවට ඔවුන් අපව විවේචනය කරනු ඇත. වසර 200 ක ඉතිහාසයක් තිබෙන වතුකරය වෙනුවෙන් ඉටුකර තිබෙන සංවර්ධනය කුමක්ද? වතු සමාගම් ඉටු කර ඇත්තේ කුමක්ද? යන්න පිළිබඳව මෙහි ප්‍රදර්ශනයට තබා ඇති ඡායාරූප මගින් නිරූපනය වේ. මෙම ඡායාරූප කුමන කාලයකට අයත් වන්නේ දැයි ඇතැම් අය විසින් විමසනු ලබන තත්ත්වයකට අපි පසුබෑමකට ලක් වී සිටින්නෙමු. වතුකරය සංවර්ධනය වී ඇතැයි පවසනු ලබන්නේ වතුතරයෙන් බැහැර වී කොළඹ ජීවත් වන වතුකරයේ අය විසිනි. මෙහි දක්නට තිබෙන ඡායාරූප අප විසින් වතුකරයේ ජීවත් වන අය හමුවේ තබන විට ඔවුන් ඊටත් වඩා දරුණු තත්ත්වයේ පවතින ප්‍රදේශවලට අපව කැටුව යාමට සූදානමින් සිටී. එනම් ඊටත් වඩා අඳුරු යුගයක් වතුකරයේ තිබෙන බව වටහා ගැනීමට හැකි වී තිබේ. වතුකරය දියුණුවට පත් වී ඇතැයි කියන ඇතැම් අයට මෙම ඡායාරූප ප්‍රදර්ශනය තුලින් පාඩම් ඉගෙන ගත හැක. වතුකරයේ එක් ප්‍රදේශයක් පමණක් උදාහරණයට ගෙන සංවර්ධනය මැන බැලීම නිවැරදි වන්නේ නැත. ඇතැම් අයට කළ හැක්කේ විවේචන එල්ල කිරීම පමණයි. කොපමණ විවේචන එල්ල කළත් සිය උත්සාහයන් දිගටම ඉදිරියට ගෙන යන බව මෙම ප්‍රදර්ශනයේ සම්බන්ධීකාරකවරයා පවසයි.

පසුගිය 26 සහ 27 දිනවල කොළඹ දී පවත්වන ලද මෙම ප්‍රදර්ශනයට යුරෝපා සංගමය හා ජර්මන් ෆෙඩරල් විදේශ අමාත්‍යාංශ කාර්යාලය මගින් සම මූල්‍ය දායකත්වය ලබා දීම සඳහා වන ශ්‍රී ලංකාවේ සංහිඳියා ක්‍රියාකාරකම් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය, ඌව ශක්ති ආයතනය හා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සහය ලැබී තිබීම මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතුව ඇත.

**කේ. ප්‍රසන්නා**

මාධ්‍යවේදී

උදය සූරියන් පුවත් පත / 01.10.2020

තේ කහට

# ආදරයේ පසු කතාව

මීට වසර දෙකකට පමණ පෙර මා ඇතුළු තවත් කණ්ඩායමක් කඳුකර ප්‍රදේශයේ වතුයාය හතරක දින කිහිපයක් සැරිසැරුවේ අලුත් වැඩක් සඳහා ආරම්භයක් ගැනීමට ය. එකී ආරම්භය නම්, තරුණ කෙල්ලන් සහ කොල්ලන් පිරිසක් සොයා ගැනීම ය. පූර්ව දැනුම්දීමක් සිදු කර තිබුණ නිසා බොහෝ පිරිසක් අදාළ ස්ථානවලට පැමිණ සිටියේ 'වතුවල තරුණ තරුණියන් වෙනුවෙන් ආරම්භ කිරීමට යන ඡායාරූප පාඨමාලාවක් සඳහා සාමාජිකයන් බඳවා ගන්නවා' යැයි පැතිර ගිය ආරංචිය නිසා ය. තලවකැලේ හොලිරූඩ් සහ ලොගි වතුයායවල් නියෝජනය කරමින් ද බුදුල්ලේ ඌව හයිලන්ඩ්ස් සහ ඇටැම්පිටිය වතුයායවල් නියෝජනය කරමින් ද පැමිණ සිටී තරුණ පිරිස බොහෝ වූහ. සහතික, පදක්කම් ඇතුළු බොහෝ දක්ෂතා ෆයිල්කවර අතරේ තුරුළුකරගෙන ඔවුහු පැමිණ සිටියෝ ය. පසුව එක වතු යායකින් සාමාජිකයන් දහය බැගින් වතු හතර නියෝජන කරමින් හතළිස් දෙනෙකු තෝරා ගනු ලැබිණි. 'තේ කහට' ප්‍රදර්ශනමාලාවේ ආරම්භය සිදු වන්නේ එසේ ය.

ජීවිතේ කිසි දා ඩිජිටල් කැමරාවක් නොදුටු, අතපත ගා නොතිබූ එම තරුණ පිරිස දිවයිනේ ප්‍රදේශ කීපයකත්, කොළඹ ලයනල් වෙන්ඩ්ට් වැනි සුප්‍රසිද්ධ කලාගාරයකත් ඔවුන්ගේ ඡායාරූප ප්‍රදර්ශනයක් කරනවායැයි සිහිනෙකුදු නොසිතන්නට ඇත."ඔබ සිහින දැකීම

නතර කරන්නේ කවදාද, ඔබ වයසට යනු ඇත" යැයි පාවුලෝ කෝයියෝ නැමති විශිෂ්ට ලේඛකයා සඳහන් කර ඇති ප්‍රකාශය තරුණ තරුණියන්ට කතා කරන මුල් අවස්ථාවේදී අප ප්‍රකාශ කළේ යමක් සාර්ථක කර ගැනීමට නම් අප ඒ සඳහා අඛණ්ඩව සිහිනයක් දැකිය යුතු බව පවසමිනි. බොහෝ දුෂ්කරතා, අපහසුතා මැද්දේ වුවද ඔවුහු එකී සිහිනය වෙනුවෙන් වෙහෙස මහන්සි වූහ.

ඡායාරූපකරණය, කලාව, සමාජ වෙනසක් උදෙසා කලාව භාවිත කිරීම, ගැටුම සහ ගැටුම් විශ්ලේෂණය, ආදී බොහෝ දේවල් පිළිබඳ දැනුම අප ඔවුන් සමඟ බෙදා ගත්තෙමු. ඒ ඔස්සේ ඔවුන්ගේ සමාජ සහ දේශපාලනික සවිඥානිකත්වය ඇති කිරීමේ කතිකාව ආරම්භ කෙරුණි. අවසන සමාජ වගකීමක් සහිත පුරවැසියෙකු, තරුණයෙකු වශයෙන් හෝ ඡායාරූප ශිල්පියකු වශයෙන් අපට කළ හැක්කේ කුමක් ද? අප කළ යුත්තේ කුමක්දැයි වඩාත් රසවත් සංවාදයකින් පසු ඔවුන් ඒකමතිකව තීරණය කළේ තමන් නියෝජනය කරන කඳුකර දෙමළ ප්‍රජාව පිළිබඳ, සමාජය නොදත් කතාව ඡායාරූප ඔස්සේ සමාජයට කිව යුතුබව ය. 'සිලෝන් ටී' නැමති සුප්‍රසිද්ධ සන්නාමය හමුවේ ලෝකයක් ශ්‍රී ලංකාව හැඳිනුවද එකී තේ නිෂ්පාදන ක්‍රියාවලිය වෙනුවෙන් උර දෙන ප්‍රජාව පිළිබඳ ලාංකේය සමාජය තුළ තිබෙන කතිකාව කුමක් ද? මෙරට පුරවැසි කණ්ඩායමක් හැටියට ඔවුන්ට හිමි තැන ලැබී ඇත්ද? අප කඳුකර තරුණ තරුණියන් හා එක්ව ඔවුන්ගේ කතාව 'තේ කහට' ඡායාරූප ප්‍රදර්ශනය ඔස්සේ ලොවට කීම ආරම්භ කළේ එසේ ය.

මෙතෙක් දෑ කීවේ'තේ කහට' ගැන නොදන්නා කෙනෙකුට යමක් දැන ගැනීම පිණිස ය.

දැන් අපි වත්මන වෙත හැරෙමු.

"දුක පෙන්නලා ප්‍රශ්න විසඳන්න පුළුවන් ද? ඒ මිනිස්සුන්ගේ ප්‍රශ්න ෆොටෝවලට ගැහුවා කියල මොකක්ද වෙන්නේ? මේකත් තව ප්‍රොජෙට් එකක් විතරයි. මේ දුකම පෙන්නන්නේ මේ සමාජයේ සංවර්ධනයක් ඇත්තෙම නැද්ද? වතුවල මිනිස්සුන්ගේ සංවර්ධනය පෙන්නලා නෑනේ?" ආදී අදහස් උදහස් අප වෙත ලැබුණේ ඡායාරූප ප්‍රදර්ශන අතරවාරයේ දී ය. සිංහල සමාජයෙන් මෙන් ම දෙමළ සමාජයෙන් ද එකී අදහස් මතු විය. එය සැබෑ ය. ප්‍රශ්න ඡායාරූපයකට ගෙනා පමණින් ගැටලු නොවිසෙදෙන බව අප දනිමු. එක පුරවැසි කණ්ඩායමක් අවුරුදු දෙසීයක් තිස්සේ මුහුණ දෙන ගැටලු රාශියක් එක රැයකින් විසඳමට තරම් මෙය ප්‍රමාණවත් නොවන බව ද දනිමු. එවැනි ආශ්චර්යක් කිරීමට තරම් අපට සර්වබලධාරී දෙවියන්ට මෙන් බලයක් ද නොමැත. දේව ලබය කෙසේ වුව ඡන්දය

ඔස්සේ ජනතා පරමාධිපත්‍ය බලය ලබාදී දී පුරවැසියන් විසින් ම පත් කර ගත් පිරිසක් පාර්ලිමේන්තුව සහ ආණ්ඩුව නියෝජනය කරන අතර මේ ප්‍රශ්න ගැටලු ක්‍රමිකව විසඳීමේ ප්‍රවේශය ඔවුන්ට ගත හැකි බව නම් දනිමු.

තලවකැලේ සහ බදුල්ල ප්‍රදර්ශනවලින් පසුව පැවති සංවාදවල දී දෙමළ සමාජයේ බොහෝ පිරිසකගේ චෝදනාව වූයේ ඔවුන්ගේ සංවර්ධනය මේ ඡායාරූපවල පෙන්වා නොමැති බව ය. කොළඹ ප්‍රදර්ශනයේ දී ද එකී ප්‍රශ්නය නැගුණි. එහිදී මේ ඡායාරූප ප්‍රදර්ශනය නියෝජනය කරන තරුණ ගුරුවරියක වන ශ්‍රී දේවි විසින් ලබා දුන් පිළිතුර ඔබ සමඟ බෙදා ගැනීමට කැමැත්තෙමි.

"ඔයාලා සංවර්ධනය කියලා අදහස් කරන්නේ මොකක්ද? කඳුකර දේශපාලකයොයි, වත්තෙන් බිහිවෙලා, වත්ත ඇතැරලාදා ගිහිපු උදවියි නිතර කියනවා වත්ත සංවර්ධනය වෙලාලු. එයාලට ලැජ්ජ ඇති වත්තේ තියන ඇත්ත ප්‍රශ්න ලෝකයට කියන්න. මේ ප්‍රදර්ශනයේ තියෙන්නේ අපි වතුගානේ ගියාම මුණ ගැහුණ ඇත්ත ප්‍රශ්න තමයි. අදටත් වතුවල අපේ ප්‍රජාව මුහුණ දෙන ඇත්ත ප්‍රශ්න තමයි. නැතුව අපි හදල ගත්තු ෆොටෝ නෙමේ. එක්කෙනෙක් ලබා ගත් දියුණුව සමස්ත සමාජය ලැබූ දියුණුවක් වෙනවද? අපිට ඕන මේ ප්‍රශ්න ආයේ ආයේ පෙන්වන්න නෙමේ, මේ ප්‍රශ්න නැතිකරන විදියේ වැඩ පිළිවෙළක් හදන්න. ඒ සඳහා එළියේ මිනිස්සු දැනුවත් කරන්න."

සැබැවින් ම කඳුකර දෙමළ ප්‍රජාවගේ සිදුව ඇති සංවර්ධය කුමක්ද? රාජ්‍ය නොවන සංවිධානයක් ගොස් වැසිකිළියක්වක් සාදා දුන් පමණට හෝ වතු පරිපාලනය මැදිහත්ව පාරක් හදා දුන් පමණට එය සංවර්ධනයැයි කියා අතපිහදා ගත හැකි ද? නිවාස ප්‍රශ්න, ඉඩම් ප්‍රශ්න, අධ්‍යාපනික, සෞඛ්‍ය ප්‍රශ්න නිසි ලෙස විසඳී තිබේද? එතකුදු නොව 'ලිපිනයක් නොමැතිකම' නිසා මේ ජනතාව විඳින පීඩාව එළියේ සමාජය දන්නේ ද? මේ පිළිබඳ පිටු ගණන් කතා කළ හැකි වුව ද මේ ඒ සඳහා ඉඩ නොවේ.

මේ තරුණ තරුණියන්ගේ උත්සාහය යනු එකී ප්‍රශ්න ගැන සමාජය කොනිති කිරීම පමණි. සමාජය විප්ලවයන් එක රැයින් සිදු වූ ඒවා නොවේ. අප වත්මනේ පුරවැසියන් ලෙස භුක්ති විඳින බොහෝ වරප්‍රසාද එක රැයකින් හිමි වූ හෝ කිසිවෙකු විසින් බන්දේසියක දමා පිරි නැමූ ඒවා නොවේ. අනවරත අරගල කරමින්, ලේ කඳුළු හෙළමින් බොහෝ මිනිසුන් බොහෝ කාලයක් තිස්සේ වැගිරූ ශ්‍රමයක ප්‍රතිඵලයකි. ඇතැම් විට අප අද භුක්ති විඳින දෑ ඔවුනට

භුක්ති විඳීමට නොහැකි වන්නට ද ඇත. ඉතින් මේ උත්සාහයට යම් සමාජ කතිකාවක් උදෙසා සමාජය සවිඥානිකත්වයක් ඇති කරමින් ආරම්භයක් ගැනීම පමණි.

මහපාරට බැස, බෝඩ් ලෑලි උස්සා මේ වෙනුවෙන් සිදුවන අරගලය තවමත් අඛණ්ඩව සිදුවෙමින් පවතී. එකී අරගලය උවමනා ය. ඒ සමඟ ම කලාව භාවිත කරමින් එකී අරගලයම එකී දැනුවත් කිරීම ම සිදු කරන්නේ කෙසේ ද යන්න අත්හදා බැලීමක් ලෙසය, මෙය සිදු වන්නේ. අප ප්‍රචණ්ඩත්වයෙන් තොරව සමාජ ප්‍රශ්න පිළිබඳ කතිකාවක් හදන්නේ කෙසේ ? අහිංසාවාදී සෘජු උපක්‍රම (*nonviolence direct actions*) භාවිත කරන්නේ කෙසේ ද? ඒ සඳහා ආකල්ප දියුණු කරන්නේ කෙසේ ද? යන්න, ඡායාරූප ප්‍රදර්ශනය පිටුපස ඇති ගැඹුරයි. පිටට නොපෙනෙන සංවාදයයි.

එසේ ම කඳුකර ප්‍රජාව ගැන බොහෝ කවි ගීත ලියා ඇති බව ඇත්ත ය. ඇතැම් ඒවා ව්‍යාජයන් ය. ප්‍රලාපයන් ය. ඇමරිකානු ජාතික මහාචාර්ය මර්තා නස්බෝම් පවසන්නේ යම් සමාජ කොට්ඨාසයට අනුකම්පා කරමින් නිර්මාණ කිරීම නොව, සමාජ කොට්ඨාසයක් දෙස සානුකම්පික පරිකල්පනය ඔස්සේ සමාජ දේශපාලන ප්‍රතිසංස්කරණ සිදු කර ගැනීම උදෙසා නිර්මාණ කළ යුතු බවය. (අමරකීර්ති, ලියනගේ/කයන්න වියන්න, පෙරවදන) නෙක කලා මිනුම් දඬු ඔස්සේ මෙම ඡායාරූප විචාරය කිරීමට වඩා දෘශ්‍ය මාධ්‍ය ඔස්සේ එවැනි සමාජ තකිතාවක් ඇති කරන්නේ කෙසේද යන සංවාදය ද 'තේ කහට'වල තැවරී තිබේ.

මෙහි ඇතැම් විට ඡායාරූපවල කලාත්මක අතින් යම් අඩුපාඩුකම් තිබෙන්නට පුළුවන. කලා විචාරයකදී මෙය ආධුනික ශිල්පීන්ගේ වැඩක් ද, ඔවුන් කැමරාවක් අත පත ගා නොතිබුණා ද ආදිය අදාළ නොවේ. නමුත් මේ ඡායාරූප ඔස්සේ සමාජය සවිඥානික වී ඇති බව පසුගිය කාලයේ දී සිදු වූ විවිධ දෑ සමඟ අපට වටහා ගත හැකි ය. ඇතැම් තේ සමාගම් විසින් මේ ඡායාරූප ඔස්සේ නිරූපිත කඳුකර කම්කරු ප්‍රජාවගේ ජන ජීවිතය නිරීක්ෂණය කිරීම සඳහා ගිය අවස්ථා ඇත. ඇතැම් සමාගම් මේ පිළිබඳ සවිඥානිකව අප හා සාකච්ඡා කළ අවස්ථා ඇත. දැන් දැන් බොහෝ සමාජ කණ්ඩායම්, දේශපාලන ව්‍යාපාර මේ ගැටලු දෙස උනන්දුවෙන් බලමින් කටයුතු කරනු පෙනේ. එපමණකදු නොව සමාජජාලා මාධ්‍ය ඔස්සේ 'තේ කහට' ගැන සවිඥානික වූ බොහෝ පිරිසක් දිවයිනේ සියලු ප්‍රදේශවල මෙය පෙන්වන්නැයි අපෙන් ඉල්ලා සිටියේ මෙහි වැදගත්කම ද කියාපාමිනි. ඉතින් මේ ආරම්භයට ප්‍රමාණවත් නොවේ ද?

මෙතෙක් දෑ පැවසුවේ 'තේ කහට' මාරයි කීමට නොව, මේ තරුණ තරුණියන්ගේ වෙහෙස මහන්සියට ගෞරව කරනු පිණිස ය. මේ සමස්ථ ක්‍රියාවලිය සඳහා දායක වූ පිරිස බොහෝ

ය. එහි ප්‍රමුඛ කොටස්කරුවන් වන්නේ, කඳුකර ප්‍රජාව සහ එම තරුණ තරුණියන් ය. තරුණ තරුණියන් නියෝජනය කරන සියලු වතුයායවල පරිපාලනයෙන් ලබා දුන් සහය ද මිළ කළ නොහේ. *SRP* ව්‍යාපෘතිය, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ඌව ශක්ති පදනම සහ සුව ශක්ති පදනම ආයතනික වශයෙන් මෙකී ක්‍රියාවලිය වෙනුවෙන් දායකත්වය සැපයූ අතර අජිත් සෙනවිරත්න සහ නදිෂ්ක රණසිංහ යන ප්‍රවීන ඡායාරූප ශිල්පීන් ඔවුන්ගේ උපරිම දායකත්වය මේ වෙනුවෙන් ලබා දුන්නෝ ය. ඒ හැර මේ ඡායාරූප පිටුපස, සමස්ථ ක්‍රියාවලිය වෙනුවෙන් ශ්‍රමය වැගිරූ පිරිස ද බොහෝ ය. ඒ සියලු දෙනාට අපගේ ගෞරවය හිමි වන්නේ මෙය අපගේ සහෝදර ප්‍රජාව වෙනුවෙන් කළ යුතු කාලීන දෙයක් නිසාවෙනි.

එසේ ම මහාචාර්ය සසංක පෙරේරා මහතා ‘තේ කහට’ ගැන තැබූ සටහනේ උපුටනයක් මා ලියා තබන්නේ, මේ ඡායාරූප ඔස්සේ කඳුකර ප්‍රජාව පිළිබඳ කතිකාව සඳහා ආරම්භයක් ගැනීමට උත්තේජනයක් වනු පිණිස ය.

“මගේ විශ්වාසය වන්නේ, මේ ප්‍රජාව පිළිබඳ දැනට මා දැක ඇති ප්‍රබලතම ඡායාරූප එකතුව මෙය බවයි. සැබැවින් ම මා සිතන්නේ මේ ප්‍රජාව පිළිබඳ මා දැනට දැක ඇති හෝ කියවා ඇති ප්‍රබලතම කතිකාවන්ගෙන් එකක් මේ බව ය” (පඨිතඃ සමාජ සංස්කෘතික සමීක්ෂණ)

අවසන, ‘තේ කහට’ යනු හුදු ඡායාරූප ප්‍රදර්ශනයක් නොව, ආදරය සහ මනුස්සකම පිළිබඳ කතාවක් බව ලියා තැබීමට කැමැත්තෙමි.

ළහිරු කිතලගම
පර්යේෂක / ලේඛක
සමබිම පුවත් පත / samabima.com / 21.01.2021





ඡායාරූපකරණය පිළිබඳ වැඩමුළු අවස්ථා





ඡායාරූපකරණය පිළිබඳ වැඩමුළු අවස්ථා





ගම් බිම්වල ඇවිදිමින් ඡායාරූපකරණයේ නියැලෙමින්






ගම් බිම්වල ඇවිදිමින් ඡායාරූපකරණයේ නියැලෙමින්





ගම් බිම්වල ඇවිදිමින් ඡායාරූපකරණයේ නියැලෙමින්





ගැටුම් විශ්ලේෂණ වැඩමුළුව



ප්‍රදර්ශන සඳහා සූදානම



ප්‍රදර්ශන සඳහා සූදානම

























# ප්‍රතිචාර බිඳක්...































C P A Publication

